

අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය

காணாமல் போன ஆட்கள் பற்றிய அலுவலகம்

OFFICE ON MISSING PERSONS

වාර්ෂික වාර්තාව

ஆண்டு அறிக்கை

ANNUAL REPORT

2021

නො.408, නෙවන මහල, ගාලු පාර, කොළඹ 03, ශ්‍රී ලංකා
இல. 408, 03ம் மாடி, காலி வீதி, கொழும்பு 03, இலங்கை
No. 408, Level 03, Galle Road, Colombo 03, Sri Lanka

පටුන - සිංහල

යහපතකිගේ පණිවුඩය 7

1. පෙරවදන 9

2. හැදින්වීම 9

3. 2016 අංක 14 දරන අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාල පනත: 10

4. විධි නියෝගය 10

5. සංවිධාන ව්‍යුහය සහ බලය: 11

6. ප්‍රාදේශීය පැවැත්ම: 12

7. වැඩසටහන් උපාය මාර්ගය: 14

7.1 වින්දිත සහ පවුල් සහය 14

7.2 ආරක්ෂාව 14

7.3 නෛතික සහ ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ 15

7.4 දක්නට නොමැති බවට වූ සහතිකය 15

7.5 අතුරු වාර්තා 16

7.6 දක්ක කළමනාකරණය 16

7.7 සමඟි පර්ෂදය 16

8. 2021 ප්‍රධාන වැඩසටහන්: 17

8.1 වින්දිත සහ පවුල් සහය 17

අ. පැමිණිලි සම්බන්ධව කටයුතු කිරීම 17

ආ. පවුල් සමඟ සන්නිවේදනය 18

ඇ.ප්‍රජා සම්බන්ධතා 18

ඈ.යොමු පද්ධතිය 18

ඉ. හානිපූරණය 18

8.2 වින්දිතයින් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම 18

8.3 නෛතික සහ ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ 19

8.4 දක්ක කළමනාකරණය 20

අ. අතුරුදහන් වූවන් සම්බන්ධ පවත්නා දක්ක එක්රැස් කිරීම 20

ආ. පැමිණිලි 21

ඇ. අතුරුදහන් වූ පුද්ගලයන්ගේ දක්ක ආකෘති පත්‍රය 23

ඈ.දක්ක පදනම 23

ඉ .පැමිණිලි ලැයිස්තුව සහ අතුරුදහන් වූ පුද්ගලයන් පිළිබඳ කොරතුරු 24

8.5 මානව සම්පත් සහ පරිපාලනය 25

අ.කාර්ය මණ්ඩලය බඳවා ගැනීම 25

ආ.ප්‍රාදේශීය කාර්යාල 26

c. පවුල් කෙරෙහි මනෝ සමාජීය ප්‍රතිවාර දැක්වීම සහ සංවේදීතාව සහතික කිරීම.....26
d.ධාරිතා වර්ධනය හා දැනුම බෙදාගැනීම.....27
e.තොරතුරු දැනගැනීමේ අයිතිය.....27

8.6 මූල්‍ය සහ ප්‍රසම්පාදනය..... 28

8.7 සන්නිවේදනය සහ ප්‍රජා..... 28
a.පොදු අවස්ථා.....28
b.මාධ්‍ය සමග සම්බන්ධතා.....28
c.ලිඛිතවල් මාධ්‍ය මත පැවැත්ම.....29

9. 2021 වසරේ අභියෝග.....29

10,ඉදිරි ගමන.....29

.11අගැයීම.....30

ඇමුණුම I

වාර්ෂික මූල්‍ය වාර්තාව

உள்ளடக்கம் - தமிழ

தவிசாளரது செய்தி 34

1.முன்னுரை 36

2.அறிமுகம் 36

3.2016 இன் 14 ஆம் இலக்க OMP சட்டத்தின் குறிக்கோள்கள் 37

4.ஆணை 37

5.அமைப்புக் கட்டமைப்பும் அதிகாரங்களும் 38

6.பிராந்தியச் செயற்பாடுகள் 40

7.நிகழ்ச்சித்திட்ட முலோபாயம் 42

7.1 பாதிக்கப்பட்டோருக்கான மற்றும் குடும்பங்களுக்கான உதவிகள் 42

7.2 பாதுகாப்பு 42

7.3 சட்ட மற்றும் கொள்கை மறுசீரமைப்புகள் 43

7.4 காணாப்படாமைக்கான சான்றிதழ் (CoA) 43

7.5 இடைக்கால அறிக்கைகள் 44

7.6 தரவு முகாமைத்துவம் 44

7.7 ஒற்றுமைக்கான கொத்தணி 44

8. 2021 இற்கான நிகழ்ச்சித்திட்டச் சிறப்பம்சங்கள் 45

8.1 பாதிக்கப்பட்டோருக்கும் குடும்பங்களுக்குமான 45
உதவிகள்
அ. முறைப்பாடுகளைக் கையாளுதல் 45
ஆ.குடும்பங்களுடனான தொடர்பாடல் 46
இ.சேவைகளைப் பெற்றுக்கொடுத்தல் 46
ஈ.பரிந்துரைக்கும் முறைமை 46
உ.நட்டஈடு 46
8.2 பாதிக்கப்பட்டோரதும் சாட்சியாளர்களதும் 47
பாதுகாப்பு
8.3 சட்ட மற்றும் கொள்கை மறுசீரமைப்புகள் 47
8.4 தரவு முகாமைத்துவம் 48
அ.காணாமற்போன ஆட்கள் குறித்த 48
தற்போதுள்ள தரவுகளைத் தொகுத்தல்
ஆ.முறைப்பாடுகள் 50
இ.காணாமற்போனஆட்களின் தரவுப் 52
படிவம்
ஈ. தரவுத்தளம் 52
உ. காணாமற்போனோர் தொடர்பான 53
தகவல்களும் முறைப்பாடுகளின்
பட்டியலும்
8.5 மனிதவளமும் நிர்வாகமும் 53
அ. ஆட்சேர்ப்பு 53
ஆ. பிராந்திய அலுவலகங்கள் 54
இ. குடும்பங்களுக்கான சமூக-உளவள 54
மற்றும் உணர்வுபூர்வமான
பொறுப்புகளை உறுதிப்படுத்துதல்
ஈ. திறன் அபிவிருத்தியும் அறிவைப் 55
பகிர்தலும்
உ. தகவலறியும் உரிமை 55
8.6 நிதியும் கொள்வனவுகளும் 56
8.7 தொடர்பாடலும் அடைவும் 56
அ. பொது நிகழ்வுகள் 56
ஆ. ஊடகங்களுடனான தொடர்பு 57
இ. எண்ணிம மயப்படுத்துதல் 57
9. 2021 இல் சந்தித்த சவால்கள 57
10.முன்னோக்கிய பாதை 57
11.நன்றி நவிலல் 58
இணைப்பு I
ஆண்டு நிதி அறிக்கை

Table of Contents

Message from the Chairperson 62

1. Preface 64

2. Introduction 64

3. Objectives of the OMP Act Number 14 of 2016 65

4. The Mandate 65

5. The Organizational Structure and Powers 66

6. Regional Presence 67

7. Programmatic Strategy 69

7.1 The Victim and Family Support 70

7.2 Protection 70

7.3 Legal and Policy Reforms 70

7.4 Certificate of Absence (CoA) 70

7.5 Interim Reports 71

7.6 Data Management 71

7.7 Unity Cluster 71

8. 2021 Programmatic Highlights 72

8.1 Victims and Family Support 72

a. Handling of Complaints 72

b. Communication with Families 73

c. Outreach 73

d. Referral System 73

e. Reparation 73

8.2 Victim and Witness Protection 73

8.3 Legal and Policy Reform 74

8.4 Data Management 74

a. Collating existing data related to missing and disappeared persons 75

b. Complaints 75

c. Missing Persons Data Form 77

d. Database 77

e. List of Complaints and information regarding Missing and Disappeared Persons 78
8.5 Human Resource and Administration 78
a. Staff Recruitment 79
b. Regional Offices 79
c. Ensuring psycho-social responsiveness and sensitivity towards families 80
d. Capacity building and knowledge sharing 80
e. Right to Information 80
8.6 Finance and Procurement 81
8.7 Communication and Outreach 81
a. Public Events 82
b. Engagement with the Media 82
c. Digital Presence 82
9. The Challenges in 2021 82
10. Way Forward 83
11. Appreciation 84

Annexure I

Annual Financial Report

කෙටි යෙදුම් මාලාව

CoA	දක්නට නොමැති බවට වූ සහතිකය
CoD	මරණ සහතිකය
CoI	විමසුම් කොමිසම
CTF	ප්‍රතිඵන්ධාන යාන්ත්‍රණය පිළිබඳ උපදේශක කාර්ය බලකාය
DNA	ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව
EU	යුරෝපා සංගමය
GSP	වරණයන් පිළිබඳ පොදු ක්‍රමය
ICRC	ජාත්‍යන්තර රතු කුරුස කමිටුව
INGOs	ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධානය
MIA	ක්‍රියාන්විතයේදී අතුරුදහන් වූ සහ බලහත්කාරයෙන් අතුරුදහන් කළ
MOFA	විදේශ අමාත්‍යාංශය
MOJ	අධිකරණ අමාත්‍යාංශය
MOU	අවබෝධතා ගිවිසුම
MSD	කළමනාකරණය සේවා දෙපාර්තමේන්තුව
NGOs	රාජ්‍ය නොවන සංවිධාන
OMP	අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය
PC	ජනාධිපති නීතිඥ
RTI	තොරතුරු දැනගැනීමේ අයිතිය
SLIDA	ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය
UN	එක්සත් ජාතීන්ගේ සංවිධානය
UNWG	එක්සත් ජාතීන්ගේ ක්‍රියාකාරී සංවිධානය
UNWGIED	බලහත්කාරී අතුරුදහන් කිරීම පිළිබඳ එක්සත් ජාතීන්ගේ ක්‍රියාකාරී කණ්ඩායම
WGIED	බලහත්කාරී අතුරුදහන් කිරීම පිළිබඳ ක්‍රියාකාරී කණ්ඩායම

සභාපතිගේ පණිවුඩය

2016 අංක 14 දරණ පනත යටතේ 2018 වසරේ ශ්‍රී ලංකාව තුළ අතුරුදන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය)OMP) පිහිටුවීම අතුරුදන් වූවන්ගේ ඉරණම පිළිබඳ සත්‍ය තහවුරු කිරීමේ වැදගත් පියවරක් ලෙස සැලකේ. පැහැදිලි විධි නියෝගයක් සහිතව ව්‍යවස්ථාදායක ක්‍රියා පටිපාටි මගහා අතුරුදහන් වූවන්ගේ ඉරණම පිළිබඳවසොයා බැලීමට අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය වෙත බලතල ලබා දී ඇත. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය පාර්ලිමේන්තු ආඥාව විසින් නම් කරන ලද සාමාජිකයින් 07 දෙනෙකුගෙන් සමන්විත වන අතර සංක්‍රාන්ති යුක්තිය, අර්ධ අධිකරණ ක්‍රියා පටිපාටි සහ මහජන දුක්ගැනවිලි හැසිරවීමේ ක්‍රියාවලිය පිළිබඳ ප්‍රවීණතාවය සහ පළපුරුද්ද පදනම් කරගෙන එක්මන් සාමාජිකයින් පත් කරනු ලැබ ඇත. දැඩි පරිශ්‍රමයක ප්‍රතිඵලයක් ලෙස අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයට අතුරුදන් වූවන්ගේ නාම ලේඛනය නිකුත් කර පරීක්ෂණ ආරම්භ කිරීමට හැකි විය.

මෙම වසර තුළ අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය, විශේෂයෙන් කාර්යාලය ක්‍රියාත්මක කිරීම සහ අතුරුදහන් වූවන්ගේ සහ අතුරුදහන් වූවන්ගේ පවුල් වෙත ළඟා වීම ඇතුළු ක්ෂේත්‍ර ගණනාවක ප්‍රගතියක් ලබා ඇත. මීට අමතරව, අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය විසින් ප්‍රධාන නීතිමය සහ ප්‍රතිපත්තිමය මැදිහත්වීම් සඟ උසස් කත්තව්‍යයේ සුද්ගල විමර්ශන සහ විමශීම් ගණනාවක් සිදු කරන ලදී. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය විසින් සංකේතාත්මක ඔද්ධීන් ගණනාවකට අදාළ තොරතුරු විශ්ලේෂණය කර සකස් කරන ලදී .2018 ජූනි මාසයේ සිට අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය සමූහ මිනීවළ 11 කැණීමේ නිරීක්ෂකයෙකු ලෙස ක්‍රියා කළ අතර එම ක්‍රියාවලිය පිළිබඳ මහජන විශ්වාසය තහවුරු කිරීමට පියවර යෝජනා කරමින් සහ මූලික ආධාර ලබා දෙමින් විමර්ශනයට සහාය විය. පැමිණිලි ක්‍රියාවට නැංවීම සඳහා අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය විසින් මෙම වාර්තාකරණ කාල සීමාව තුළ කිලිනොච්චියේ ප්‍රාදේශීය කාර්යාලයක් විවෘත කරන ලද අතර එමගින් යොමු කිරීමේ සේවා සහ ඉදිරි විමර්ශන සඳහා පහසුකම් සැලසෙනු ඇත. නව එකතු කිරීමත් සමග අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය සතුව මේ වන විට ප්‍රාදේශීය කාර්යාල 5ක් ඇත අතුරුදහන් වූවන් සැමරීමේ ප්‍රයත්නයේ කොටසක් ලෙස .අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය විසින් ශ්‍රී ලංකාවේ අතුරුදහන් වූවන්ගේ ජාත්‍යන්තර දිනය සැමරීමේ උත්සවය අමාත්‍යාවරුන්, සිවිල් සංවිධාන නියෝජිතයින්, අතුරුදහන් වූවන්ගේ පවුල්වල සාමාජිකයින්ගේ සහභාගිත්වයෙන් පවත්වන ලදී .

එමෙන්ම, අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය, ද්විත්ව ගණනය සහ බහුවිධ පැමිණිලිවලට අදාළ ගැටළු කුරන් කිරීම සඳහ ආගමන හා විගමන පාලක ජනරාල්, ආගමන හා විගමන දෙපාර්තමේන්තුව, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව (උපත්සහ මරණ), ගානිසුර්ණ කාර්යාලය සහ අමාත්‍යාංශ සමග සහයෝගීතාවයෙන් කටයුතු කරයි .GSP+ වෙළඳ සහනය සඳහා ප්‍රතිවාර වශයෙන් ජාත්‍යන්තර සම්මුතීන් 27කට අනුකූල වීමට ශ්‍රී ලංකාව ලබා දී ඇති ප්‍රතිඥාවන්හි ප්‍රගතිය තක්සේරු කිරීම සඳහා පස් දෙනෙකුගෙන් යුත් යුරෝපීය සංගමයේ (EU) නියෝජිත කණ්ඩායම අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය සහ නිලධාරීන් සමඟ සාකච්ඡාවක් පවත්වා ඇත. ක්‍රියාවලියේ සාර්ථකත්වයට සහ ප්‍රගතියට ඉමහත් දායකත්වයක් ලබා දීම පිළිබඳව නියෝජිත පිරිස සිය ප්‍රසාදය පළ කර ඇත .ICRC කණ්ඩායම, රාජ්‍ය තාන්ත්‍රික ප්‍රජාව, පරිත්‍යාගශීලී ආයතන, තානාපති කාර්යාල සමුවීම පසුගිය වසර තුළ අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ ක්‍රියාකාරකම්වල සැලකිය යුතු වර්ධනයක් පිළිඹිබු කළේ ය.

ජාත්‍යන්තර මානව හිමිකම් නීතිය සහ ජාත්‍යන්තර මානුෂීය නීතිය උල්ලංඝනය වී තිබෙද යන්න සොයා බැලීම සඳහා වූ පසුගිය කොමිෂන් සභාවල සොයාගැනීම් විමර්ශනය කිරීමට කොමිසමට බලය ඇත, එවැනි සොයාගැනීම් සිදුවී ඇත්නම්, වගවීම් පිළිබඳ පසුගිය කොමිෂන් සභාවල නිර්දේශ ක්‍රියාවට නංවා තිබෙද යන්න සහ වගවීමේ අරමුණු ඉදිරියට ගෙනයාම සඳහා ඉදිරියේදී අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග මොනවාදැයි සොයා බැලීම සඳහා කොමිසමට නවදුරටත් විධි නියෝග ලබා දී ඇත.

එමෙන්ම, අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය වෙත වාර්තා වන සියලුම පැමිණෙන හෝ නව පැමිණිලි පහසු විපරම් කිරීම මගින් එහි කටයුතු සඳහා හිතකර පරිසරයක් නිර්මාණය කිරීමට සහ එවැනි සිදුවීම් නැවත සිදු

නොවීම සහතික කිරීමට අතුරුදහන් වූ කැනැත්තන් පිළිබඳ කාර්යාලය පියවර ගෙන ඇත ඒ අනුව පහුගිය මාස . 12 ක වාර්තාවලින් හෙළි වූයේ බලහත්කාරයෙන් අතුරුදන් කිරීම් සම්බන්ධයෙන් පැමිණිලි ලැබී නොමැති බවයි.

කොවිඩ-19 වසංගතය විසින් පනවන ලද සීමාවන් පැවතිය ද , ශ්‍රී ලංකාව තුළ සංගිදියාව ඇති කර ගැනීම සඳහා අතුරුදහන් වූවන්ගේ පවුල්වල සත්‍යයට සහ යුක්තියට ඇති අයිතිවාසිකම් සාක්ෂාත් කරගත යුතු බව අතුරුදහන් වූ කැනැත්තන් පිළිබඳ කාර්යාලය විශ්වාස කරයි. මේ සඳහා අතුරුදහන් වූ කැනැත්තන් පිළිබඳ කාර්යාලය, අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්, කාර්ය මණ්ඩලය, සිවිල් සමාජ සංවිධාන, අතුරුදහන් වූවන්ගේ පවුල් සහ හවුල්කරුවන් අනාගත කොමිෂන් සභාවට සහ නිලධාරීන්ට අදාළ රාජ්‍ය ආයතනවල සහ දෙපාර්තමේන්තුවල පූර්ණ සහයෝගය ඇතිව එහි වීධි නියෝග සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක කළ හැකි සහ එහි කාර්යයන් සහ වගාකීම් නිසි ලෙස ක්‍රියාත්මක කිරීමට හැකි වන පුළුල් පදනමක් නිර්මාණය කර ඇත.



සභාපති
අතුරුදහන් වූ කැනැත්තන් පිළිබඳ කාර්යාලය

1. පෙරවදන

අතුරුදහන් වූ සහ අතුරුදහන් වූවන්ගේ පවුල්වල ලාංකික සමාජයේ අවදානමට ලක් වූ කොටසට දැනෙන දැඩි පීඩනය සැලකිල්ලට ගෙන, අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය විසින් 2020 අප්‍රේල් මසදී අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා වෙත ලිපියක් යවමින්, කොවිඩ් සහන සැලසීමේදී පවුල්වල තත්වයන් මැන බලන ලෙස නිර්දේශ කළේය.

ජනාධිපති කාර්ය සාධක බලකාය පිහිටුවන ලද 2020 මාර්තු 6 දිනැති අංක 2168/8 දරන ගැසට් පත්‍රයේ 11 ඡේදය මගින් "ඉහත ක්‍රියාමාර්ග ගැනීමේදී සෘජුවම අවදානමට පත් වන කාන්තාවන්, අඩු ආදායම්ලාභී පවුල් සහ පුද්ගලයින් කෙරෙහි විශේෂ අවධානයක් යොමු කිරීමට පියවර ගන්නා මෙන්", කාර්ය සාධක බලකායට නිශ්චිත නියෝගයක් ලබා දුන් බව අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය නිරීක්ෂණය කළේ ය.

අතුරුදහන් වූවන්ගේ පවුල් අතර වඩාත් අවදානමට ලක්විය හැක්කේ වයෝවෘද්ධ අය සිටින සහ එක් පවුලේ සාමාජිකයෙකුගේ දෛනික වැටුපෙන් දිවි ගෙවන කාන්තා - මූලික පවුල් බව අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය නිරීක්ෂණය කරයි. රටේ පවතින වාතාවරණය නිසා ඔවුන්ට තවදුරටත් තම ජීවනෝපාය මාර්ගයන් කර ගැනීමට නොහැකිව ඇති අතර සීමිත වත්කම් හෝ වත්කම් නොමැති බව මෙම පවුල් කෙරෙහි දැඩි ප්‍රතිවිපාක ගෙන දී ඇත.

වර්තමාන අර්බුදයට ප්‍රතිචාර වශයෙන් ආහාර සහ මූල්‍ය ආධාර සැපයීම ඇතුළු ඕනෑම යෝජිත සහන පියවරයන් සඳහා අතුරුදහන් වූවන්ගේ පවුල් ඇතුළත් කළ යුතු බවට අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය නිර්දේශ කළේ ය. විශේෂයෙන් කෙටි කාලීන පියවරක් ලෙස, අතුරුදහන් වූවන්ගේ පවුල් සඳහා ග්‍රාම නිලධාරීන් හරහා වියළි සලාක ලබා දෙන ලෙස අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය විසින් නිර්දේශ කරන ලදී. ග්‍රාම නිලධාරීන් මේ වන විටත් තම ප්‍රදේශයන් තුළ අතුරුදහන් වූ තැනැත්තන් සම්බන්ධයෙන් තොරතුරු රැස් කර ඇත. එවැනි ලැයිස්තු මගින් අවදානමට ලක්විය හැකි පුද්ගලයින් සඳහා වන වෙනත් රාජ්‍ය ආධාර යෝජනා ක්‍රම යටතේ එවැනි පවුල් ප්‍රතිලාභීන් වන විට ද්විගණනය වීම වළක්වා ගත හැකිය. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය විසින් මෙම සහන කටයුතු සම්බන්ධීකරණය කිරීමෙහි ලා කැපවී සිටි අතර, 2021 කාලය තුළ එහි නියැලීම අවශ්‍ය විය.

2. හැඳින්වීම

2016 අංක 14 දරණ අතුරුදන් වූවන් පිළිබඳ කාර්යාල පනත 2016 අගෝස්තු මාසයේදී ශ්‍රී ලංකාව තුළ අතුරුදහන් වූවන් සම්බන්ධ කාර්යයන් ඉටු කිරීම සඳහා බලාත්මක කරන ලදී. අතුරුදහන් වූවන් සෙවීම සහ සොයා ගැනීම සඳහා විධිවිධාන සැලසීමේ පනතක් වන මෙමගින්; අතුරුදහන් වූවන්ගේ ඥාතීන්ට ආධාර සැපයීමට; අතුරුදහන් වූවන් පිළිබඳ දත්ත ගබඩාවක් පිහිටුවීම සඳහා; පවරා ඇති බලතල සහ කාර්යයන් සඳහා අදාළ වන ක්‍රියා පටිපාටි සහ මාර්ගෝපදේශ සැකසීම සඳහා; පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම හා සම්බන්ධ හෝ ආනුෂංගික සියලු කරුණු සඳහා විධිවිධාන සැලසීම සිදු කෙරේ. යම් කිසි පුද්ගලයෙකු අතුරුදහන් වූ කාලසීමාව නොතකා අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය ඒ සම්බන්ධව ක්‍රියාත්මක වෙයි.

අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය ව්‍යවස්ථාදායක සභාවේ නිර්දේශය මත ශ්‍රී ලංකා ජනාධිපති විසින් පත් කරන ලද සාමාජිකයින් යත් දෙනෙකුගෙන් සමන්විත වෙයි. අතුරුදහන් වූ තැනැත්තන්ගේ කාර්යාලයට සාමාජිකයින් පත් කිරීමේදී ශ්‍රී ලාංකීය සමාජයේ බහුවිධතාව පිළිඹිබු කරන ආකාරයෙන් එහි සංයුතිය පවත්වා ගැනීමට වග බලා ගැනේ. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ සාමාජිකයින්, විමර්ශන, මානව හිමිකම් නීතිය, ජාත්‍යන්තර මානුෂවාදී නීතිය, මානුෂවාදී ප්‍රතිචාර සම්බන්ධයෙන් පළපුරුද්ද සහිත හෝ අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ කටයුතු සිදු කිරීමට අදාළ සුදුසුකම්වලින් සමන්විත පුද්ගලයන් විය යුතු ය.

2021 දෙසැම්බර් දක්වා අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ සභාපතිව සිටි විශ්‍රාමික ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරයෙකු වන උපාලි අබේරත්න මහතා පසුව තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ කොමිෂන් සභාවේ සභාපති ලෙස පත් කරන ලද අතර අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ නව සභාපති ලෙස 2021 දෙසැම්බර් මස 16 වන දින මහේෂ් කටුලන්ද මහතා (නීතිඥ) පත් කරන ලදී. වාර්තාකරණ කාල සීමාව තුළ, අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ පෙර හෝ පළමු සාමාජිකයින් ඔවුන්ගේ කාලය සම්පූර්ණ කර තිබූ අතර අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා විසින් නව සාමාජිකයින් පත් කරන ලදී. ඒ අනුව, විජේකෝන් බණ්ඩාර ගනේගල මහතා, තම්බයියා යෝගරාජා මහතා, සිතී ඩෙන් අර්ෆා තාසීම් මිය, ජයන්ත වික්‍රමරත්න මහතා සහ ගිරන්ති විජේමාන්න මිය පත් කරන ලදී. ගිරන්ති විජේමාන්න මිය ඉල්ලා අස් වූ බැවින්

2021 දෙසැම්බර් මස ජයන්ත වික්‍රමරත්න මහතා පත් කරන ලද අතර 2021 දෙසැම්බර් 23 දින ගිරාඟේ එම තූර්දීන් මහතා පත් කරන ලදී.

අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ පරිපාලන කාර්යාලය අංක 408, ගාලු පාර, කොළඹ 03, පිහිටා ඇත. දුරකථන; 011 230 1685 ෆැක්ස්: 011 230 1921, ඊමේල්; ompsrilanka@gmail.com, වෙබ්: www.omp.gov.lk ප්‍රාදේශීය කාර්යාල ; යාපනය, මන්නාරම, මඩකලපුව, මානර සහ කිලිනොච්චිය. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය විසින් පවුල් සහ සාමාන්‍ය ජනතාවට වැඩි ප්‍රවේශයක් ලබා දීම සඳහා ප්‍රාදේශීය කාර්යාල හතරක් සහ උප ප්‍රාදේශීය කාර්යාල අටක් පිහිටුවීම ඉලක්ක කර ඇත. ප්‍රාදේශීය කාර්යාල පිළිබඳ විස්තර ප්‍රාදේශීය පැවැත්ම අංශය යටතේ දක්වා ඇත.

3. 2016 අංක 14 දරන අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාල පනත:

පහත කරුණු සඳහා සියලු අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇති බව තහවුරු කිරීම;

(අ) අතුරුදහන් වූවන් සෙවීම සහ සොයා ගැනීම සඳහා යාන්ත්‍රණයක් ඇපයීම සහ එවැනි පුද්ගලයින් අතුරුදහන් වූ අවස්ථා පැහැදිලි කිරීම;

*(ආ)*පනතේ අර්ථය තුළ 'අතුරුදහන් වීමේ' සිදුවීම අවම කිරීම සඳහා අදාළ බලධාරීන්ට නිර්දේශ ඉදිරිපත් කිරීම;

(ඇ) පනතේ විධිවිධාන දක්වා ඇති පරිදි අතුරුදහන් වූවන්ගේ සහ ඔවුන්ගේ ඥාතීන්ගේ අයිතිවාසිකම් සහ අවශ්‍යතා ආරක්ෂා කිරීම;

(ඈ) එවැනි අතුරුදහන් වූවන්ට හෝ ඔවුන්ගේ ඥාතීන්ට සහන සැලසිය හැකි නිසි සහන මාර්ග හඳුනා ගැනීම.

4. විධි නියෝගය:

අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයට පහත විධි නියෝගය ඇත;

(අ) අතුරුදහන් වූවන් සෙවීම, සොයා ගැනීම සහ ඒ සඳහා සුදුසු යාන්ත්‍රණයන් හඳුනා ගැනීම සහ එවැනි පුද්ගලයන් අතුරුදහන් වූ තත්ත්වයන් පැහැදිලි කිරීම;

*(ආ)*අතුරුදහන් වීමේ සිදුවීම අවම කිරීම සඳහා අදාළ බලධාරීන්ට නිර්දේශ ඉදිරිපත් කිරීම;

(ඇ) පනතේ විධිවිධාන දක්වා ඇති පරිදි අතුරුදහන් වූවන්ගේ සහ ඔවුන්ගේ ඥාතීන්ගේ අයිතිවාසිකම් සහ අවශ්‍යතා ආරක්ෂා කිරීම;

(ඈ) අතුරුදහන් වූ පුද්ගලයන්ට සහ අතුරුදහන් වූවන්ගේ ඥාතීන්ට නීතිකම් ඇති සහන සැලසීමේ මාර්ග හඳුනාගෙන අතුරුදහන් වූ පුද්ගලයාට (ජීවත්වන විට හමුවූවහොත්) හෝ එවැනි අතුරුදහන් වූ පුද්ගලයාගේ ඥාතියෙකුට දැනුම් දීම;

(ඉ) දැනට සිදුකෙරෙන ක්‍රියාවලීන් හෝ වෙනත් ආයතන, සංවිධාන, රාජ්‍ය දෙපාර්තමේන්තු, විමසුම් කොමිසම, සහ විශේෂ ජනාධිපති විමසුම් කොමිෂන් සභා මගින් ලබාගන්නා අතුරුදහන් වූවන් පිළිබඳ දත්ත එක් රැස් කිරීමක් ඒවා අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය යටතේ ස්ථාපිත දත්ත පදනමක් තුළ මධ්‍යගත කිරීම;

(ඊ) පනත යටතේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය විය හැකි අනෙකුත් අවශ්‍ය සියලු දේ සිදු කිරීම.

එමෙන්ම, යම් කිසි පුද්ගලයෙකු අතුරුදහන් වූ කාලසීමාව නොතකා ඒ සම්බන්ධව ක්‍රියාත්මක වීම අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ විධි විධානය වෙයි.

5. සංවිධාන ව්‍යුහය සහ බලය:

අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයට බලතල සහ කාර්යභාරයන් ගණනාවක් පවරා ඇති අතර, දක්නට නොමැති බවට වන සහතිකය නිකුත් කිරීම සඳහා රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවට ගැනිවන පරිදි අතුරුදහන් වූ තැනැත්තන්ගේ ඥාතීන්ට අතුරු වාර්තා නිකුත් කිරීම; අතුරුදහන් වූ තැනැත්තන්ගේ ඥාතීන්ට මනෝ සමාජයිය සහය ලබාදීම ඇතුළු සුබසාධන සේවාව සහ පරිපාලන සහය ලබාදීම හෝ ඒ සඳහා පහසුකම් සැපයීම; අතුරුදහන් වූ තැනැත්තන්ගේ ඥාතීන්ට හානිපූරණයන් ලබාදීම සඳහා අදාළ බලධාරීන්ට නිර්දේශ සැපයීම; විත්දිනයින් සහ සාක්ෂිකරුවන් අරක්ෂා කිරීම සඳහා ක්‍රම පද්ධතියක් සංවර්ධනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම; අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ සියලු විස්තර සහිත දත්ත පදනමක් නිර්මාණය කිරීම; කළමනාකරණය කිරීම සහ පවත්වා ගැනීම; අතුරුදහන් වූ තැනැත්තන්ගේ පවුල්වලට සිදු වූ හානිය සහ ඔවුන් පක්ෂ වූ වෙදනාකාරී කත්ත්වය සම්බන්ධව මහජන දැනුවත්භාවය සහ සංවේදීකාව ඇති කිරීම හා ඔවුන්ගේ අවශ්‍යතාවන් සපුරාගැනීමට සහ ආර්ථික, මනෝ සමාජයිය, නෛතික සහ පරිපාලන සහය වෙත පිවිසීම සහතික කිරීමට මහජනතාවගේ සහය ලබාගැනීමට පහසුකම් සැලසීම ඒ අතර වෙයි.

මෙම වගකීම ඉටු කිරීමට, ස්ත්‍රී පුරුෂභාවය පිළිබඳව - සංවේදී මාර්ගෝපදේශ ශංවර්ධනය කිරීමට, කාර්ය මණ්ඩලය පත් කිරීමට සහ ඉවත් කිරීමට සහ එහි ඵලදායී ක්‍රියාකාරිත්වය සඳහා අවශ්‍ය ඒකක පිහිටුවීමට අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයට බලතල ඇත.[1] වාර්තාකරණ කාල සීමාව තුළ, අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය පහත ඒකක සමඟ ක්‍රියාත්මක විය.

1. ආරක්ෂණ ඒකකය
2. නීති, ප්‍රතිපත්ති සහ පර්යේෂණ ඒකකය
3. විත්දිත සහ පවුල් සහය ඒකකය
4. දත්ත ඇතුලත් කිරීමේ ඒකකය.
5. මූලා සහ ප්‍රසම්පාදන ඒකකය
6. මානව සම්පත් සහ පරිපාලන ඒකකය

දැනට පවතින ඒකක නිබියදී හන්නිවෙදන, ප්‍රජා සම්බන්ධතා, නිරීක්ෂණ සහ විමර්ශන ඒකක ස්ථාපිත කිරීමට 2021 වසරේදී අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය සාකච්ඡා පැවැත්වීය. ශ්‍රී ලංකාවේ එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සහය සහිතව ක්‍රියාත්මක වන නීති, ප්‍රතිපත්ති සහ පර්යේෂණ ඒකක ක්‍රියාත්මක වන්නේ රජය සහ එක්සත් ජාතීන් අතර ඇතිකරගත් ගිවිසුමක් යටතේ ය. 2021 මුල් භාගයේදී මෙම ගිවිසුම අවසන් වූ අතර පවතින කාර්ය මණ්ඩලය සමඟ කටයුතු සිදු කරන ලදී.

එමෙන්ම, ඉදිරියේදී අතුරුදහන් වීම වැලැක්වීම; ස්මරණයන් සඳහා ක්‍රම සකසා දීම සහ අතුරුදහන් වීම පිළිගැනීම; භදුනාගත් සහ භදුනා නොගත් මළ ශිරුරු සම්බන්ධව කටයුතු කිරීම; මහජනයා දැනුවත් කිරීම සඳහා අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ ගැටළු සම්බන්ධව තොරතුරු පල කිරීම; අතුරුදහන් වූ තැනැත්තන්ට අදාළ ජාතික නීති සහ රෙගුලාසි සංවර්ධනය කිරීම; අතුරුදහන් වූ පුද්ගලයන් සහ ඔවුන්ගේ ඥාතීන්ගේ සමාජ සහ ආර්ථික තත්ත්වයන් වැඩි දියුණු කිරීම පිණිස හානිපූරණයන්, මනෝ සමාජයිය සහය සහ වෙනත් විධික්‍රමයන් සපයා දීම ඇතුළු ගැටළු ගණනාවක් සම්බන්ධව අනෙක් රාජ්‍ය බලාධිකාරීන්ට නිර්දේශ සැපයීමේ බලයද අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයට ඇත.

මෙම බලතල ඵලදායී සහ කාර්යක්ෂම ලෙස ක්‍රියාත්මක කිරීමට අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාල නිරීක්ෂණ සහ විමර්ශන ඒකකය හා හන්නිවෙදන සහ ප්‍රජා සම්බන්ධතා ඒකකයක් ස්ථාපිත කිරීමට අභ්‍යන්තර සාකච්ඡා පවත්වන ලදී.

එහි විමර්ශනයන් සිදු කිරීම පිණිස පැමිණිලි භාරගැනීමට, විමසුම් ආරම්භ කිරීමට සහ අතුරුදහන් වූ තැනැත්තන් සිටින ස්ථානය විමර්ශනය කිරීමට; අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ පෙනී සිටින මෙන් කැඳවීම හෝ ලේඛනයක් හෝ වෙනත් යමක් ඉදිරිපත් කිරීම ඇතුළු අවශ්‍ය සියලු ක්‍රියාමාර්ග ගැනීමට; රහස්‍ය තොරතුරු පිළිගැනීමට හෝ කැමරාව මඟ තොරතුරු සටහන් කරගැනීමට; රහස්‍යතාව ආරක්ෂා කිරීමේ කොන්දේසි මත තොරතුරු පිළිගැනීමට; කැණීමක් සිදු කිරීමට හෝ මෘත ශරීර ගොඩගැනීමට අවශ්‍ය වන නිශේගයක් සඳහා

[1]අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාල පනත 13 වගන්තිය

මහේස්ත්‍රාත් අධිකරණයෙන් ඉල්ලීමක් කිරීමට; ඕනෑම රඳවාගැනීම ස්ථානයක් වරෙන්තුවක් රහිතව සෙවීමට; සහ සිදු කරන ලද වරදක් සම්බන්ධයෙන් අදාළ නීති ක්‍රියාත්මක කිරීමේ හෝ අභිචෝදක අධිකාරියකට වාර්තා කිරීමට අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයට නිශ්චිත බලතල ඇත.[2]

අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ පෙනී සිටීමට හෝ අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය වියින් නිකුත් කරන ඕනෑම නියෝගයක් හෝ වෙනයම් දෙයක් ඉදිරිපත් කිරීමට අපොහොසත් වීම; අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය විසින් එම පුද්ගලයා වෙත යවන ලද දැන්වීමක් හෝ ලිඛිත නියෝගයකට අනුකූල වීම හෝ ප්‍රශ්නවලට පිළිතුරු දීමට ප්‍රතික්ෂේප කිරීම; තම බලය ගාවිත කිරීමේදී අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ නිලධාරියෙකුට බාධා කිරීම; හෝ දැනුවත්ව අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ වැඩ කටයුතුවලට බාධා කිරීම, ඇතුළුව අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ බලයට විරුද්ධව කටයුතු කිරීමෙන් ඕනෑම පුද්ගලයෙකු එහි බලයට අගෞරව කිරීම සම්බන්ධයෙන් වැරදිකරුවෙකු කළ හැකිය.[3]

පවතින නීති සහ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා පහසුකම් සපයන අතර නීතියේ ආධිපත්‍යය, අතුරුදහන් වූවන් සහ ඔවුන්ගේ පවුල්වල අයිතීන් සහ අභිලාෂයන්ගේ මධ්‍යගතභාවය පිළිගන්නා පරිදි අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය එහි අරමුණු ක්‍රියාවේ යොදවා ඇත. එමෙන්ම, අතුරුදහන් වූවන්ගේ පවුල් විසින් අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය සමඟ පසුගිය වසර තුන තුළ පැවැත්වූ පොදු රැස්වීම්වලදී ඍජුවම බෙදාගත් අදහස්ද ඇතුළුව ප්‍රතිසංධාන යාන්ත්‍රණ සඳහා වන උපදේශන කාර්ය සාධක බලකායේ (CTF) නිර්දේශ මඟින් ද කාර්යාලය මඟ පෙන්වීමක් ලබා ඇත.[4]

අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය විශාල වශයෙන් කාර්ය මණ්ඩල හිඟයකට මුහුණ දී ඇති අතර එම නිසා එහි කටයුතුවලට දැඩි බාධාවන් ඇති වී ඇත. කලමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මඟින් තාත්කාලික පදනම මත 1 අයෙක්ද, සේවය කරන ලද අතර පුහුණුලාභීන් 22 දෙනෙකු දක්ෂ ඇතුලත් කිරීමේ අංශය, මූල්‍ය හා පරිපාලන අංශයට අනුයුක්ත කර ඇති අතර තනතුරු 228ක් සම්පූර්ණ කල යුතුව තිබේ. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාල කාර්යක්ෂම හා ඵලදායි ක්‍රියාකාරිත්වයට බාධාවක් වන බැවින් කාර්ය මණ්ඩල හිඟය පියවා ගත යුතු අතර 2022 වර්ෂය සඳහා මෙය ප්‍රමුඛතාවයක් බවට පත්ව ඇත.

6. ප්‍රාදේශීය පැවැත්ම:

අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය සමස්ත රට පුරාම ක්‍රියාත්මක වන අතර එහි ප්‍රධාන කාර්යාලය කොළඹ පිහිටා ඇත. එයට අමතරව ප්‍රාදේශීය සහ උප ප්‍රාදේශීය කාර්යාල පිහිටා ඇත. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය ප්‍රාදේශීය කාර්යාල 12ක් පිහිටුවීමට විධි විධාන ලබා ඇති අතර වාර්තාකරණ කාල සීමාව තුළ කිලිනොච්චියේ ස්ථාපිත කරන ලද කාර්යාලය ඇතුළුව කාර්යාල පහක් ඇත.



[2]අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාල පනත, 12 වගන්තිය.
[3]අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාල පනත, 24 වගන්තිය.
[4]ප්‍රතිසංධාන යාන්ත්‍රණ උපදේශන කාර්ය සාධක බලකායේ අතුරු වාර්තාව (අගෝස්තු, 2016); ප්‍රතිසංධාන යාන්ත්‍රණ උපදේශන කාර්ය සාධක බලකායේ අවසන් වාර්තාව, කාණ්ඩ I සහ II (2016 නොවැම්බර් 17)

ප්‍රාදේශීය කාර්යාලය - මඩකලපුව
අංක 124, සෙන්ට්‍රල් පාර, මඩකලපුව
දුරකථන: 065-222-4532/4534

ප්‍රාදේශීය කාර්යාලය, යාපනය
124, අධ්‍යාපනම් පාර
කලව්යන්කඩු, යාපනය
දුරකථන:021-2219414/9400/9401 /
ෆැක්ස්: 021-221-9414

ප්‍රාදේශීය කාර්යාලය- මන්නාරම
අංක 5, දුම්රියපොළ පාර,
මන්නාරම
දුරකථන: 023-2222083 /ෆැක්ස්: 023- 2223929

ප්‍රාදේශීය කාර්යාලය, මාතර
අංක 54, ධර්මාරාම පාර,
මාතර
දුරකථන: 041- 2244684 / 041- 2224046/
ෆැක්ස් : 041-2244684

ප්‍රාදේශීය කාර්යාල- කිලිනොච්චිය
A9 පාර, අධිකරණය අසළ, කිලිනොච්චිය
දුරකථන: 021-2219400

ප්‍රාදේශීය කාර්යාල ප්‍රාදේශීය සම්බන්ධීකාරකවරුන්ගේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වන අතර අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ පහත කටයුතු ඉටු කරනු ලබයි:

- අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ ප්‍රාදේශීය කාර්යාලය හාර නිලධාරියා ලෙස ක්‍රියා කරයි.
- අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ අධ්‍යක්ෂ මණ්ඩලය සෑම්මකට පක්වන පරිදි ප්‍රාදේශීය කාර්යාලවල මූලා සහ පරිපාලන කටයුතු පවත්වාගෙන යාම.
- ප්‍රාදේශීය මට්ටමින් නිරීක්ෂණ, විමර්ශනය, විත්දිකයන් සහ පවුල් වෙත සහාය සහ ආරක්ෂණ ක්‍රියාකාරකම් අධීක්ෂණය කිරීම සඳහා වගකීම දැරීම.
- ප්‍රාදේශීය කාර්යාලයේ කාර්ය මණ්ඩලය විසින් සිදු කරනු ලබන කාර්යයන් අධීක්ෂණය කිරීම සහ කාර්යාලයේ සුමට හා ඵලදායී ක්‍රියාකාරිත්වය සහතික කිරීම.
- අතුරුදහන් වූවන් සම්බන්ධ ගැටළු සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපති/ සාමාජිකයින් හෝ විධායක අධ්‍යක්ෂවරයා සමග සාකච්ඡා කර පළාත් සහ දිස්ත්‍රික් මට්ටමින් අනෙකුත් රාජ්‍ය ආයතන සමඟ සන්නිවේදනය කිරීම, සම්බන්ධීකරණය කිරීම සහ පෙනී සිටීම.
- විධායක අධ්‍යක්ෂ සහ නීති උපදේශ / විමර්ශන ඒකකය සම්බන්ධීකරණය කර අතුරුදහන් වූවන්ගේ පවුල්වලට අතුරු වාර්තා නිකුත් කිරීම සඳහා පරීක්ෂණ/ විමර්ශන සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම.
- අතුරුදහන් වූවන්ගේ පවුල් විසින් මතු කරන ලද ආරක්ෂක ගැටළු අධීක්ෂණය කර ආරක්ෂක ඒකකය සමග සම්බන්ධීකරණය කිරීම සහ ඒ අනුව ඉදිරි කටයුතු සිදු කිරීම.
- අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ විධායක අධ්‍යක්ෂ සමඟ සාකච්ඡා කර කලාපය තුළ ඇති සියලුම විත්දිකයින් සහ පවුල් ආධාර ක්‍රියාකාරකම් සිදු කිරීම.
- අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ විධි නියෝගයට අනුව අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය විසින් ගත යුතු ක්‍රියාමාර්ග ගදුනාගැනීමට ප්‍රදේශයේ සංවර්ධනයන් අධීක්ෂණය කිරීම.
- ක්‍රියාකාරකම් සහ අවශ්‍යතාවල ප්‍රගතිය හා ප්‍රාදේශීය කාර්යාල විසින් මුහුණ දෙන අභියෝග සම්බන්ධව ප්‍රධාන කාර්යාලයට වාර්තා කිරීම.
- විධායක අධ්‍යක්ෂ වෙත ප්‍රාදේශීය කාර්යාලවල කාලානුරූප ප්‍රගති වාර්තා නියමිත කාලයට යැවීම.
- ප්‍රාදේශීය කාර්යාලවල එදිනෙදා කටයුතු සම්බන්ධව අංශ ප්‍රධානීන් සමග සම්බන්ධීකරණය කිරීම.
- මනා දත්ත පදනමක් පවත්වා ගැනීම සඳහා දත්ත කළමනාකරණ අංශයේ ප්‍රධානියා සමග සාකච්ඡා කිරීම.

2021 මුළු මහත් ලොවටම අභියෝගාත්මක වූ වසරක් වූ අතර ශ්‍රී ලංකාවටද එය එසේම විය. කොවිඩ් 19 වසංගතය විසින් ඇති කරන ලද සෞඛ්‍ය ගැටළු හේතුවෙන් ශ්‍රී ලංකාව සමාජ සහ ආර්ථික අභියෝග රැසකට මුහුණ දුන්නේ ය. මීට අමතරව, රට තුළ දීර්ඝ කාලීන වසා දැමීම් සහ සංචරණ සීමා කිරීම් කාර්යාලයේ

ක්‍රියාකාරීත්වයට බොහෝ දුරට බාධාවක් විය. එබැවින්, වයරේ කාර්ය සාධන ඇගයීමේදී, වැඩසටහන් වක්‍රය තුළ මුහුණ දුන් අභිරුකාවන් ද සැලකිල්ලට ගත යුතු ය.

7. වැඩසටහන් උපාය මාර්ගය:

අතුරුදහන් වූ නනැත්තන් පිළිබඳ කාර්යාලය, 2021 වසර සඳහා වැඩසටහන් උපාය මාර්ගය සංවර්ධනය කිරීමේදී රාජ්‍ය සහ රාජ්‍ය නොවන පංශුවකරුවන් සමඟ සාකච්ඡා පැවැත්වී ය. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය එහි නව සභාපති මහේෂ් කටුලන්ද මහතා සමඟ එහි උපායමාර්ගික ඵලශ්‍රුම නැවත සමාලෝචනය කළ අතර එහිදී 2021 අවසන පගත කරුණු සම්බන්ධව අවධානය යොමු කිරීමට සාකච්ඡා කරන ලදී:

වැළැක්වීමේ සියවර - වැළැක්වීමේ උපාය මාර්ග හරහා අතුරුදහන්වන්නන් සංඛ්‍යාව අඩු කිරීම, ළමුන්, කරුණයින් සහ වැඩිහිටියන් නැවත නැවතත් අතුරුදහන් වන අවස්ථාවන්හිදී දැනුවත් කිරීම සහ ඉක්මන් මැදිහත්වීම.

ආරක්ෂණ පියවර - අතුරුදහන් වූ පුද්ගලයා සොයා ගැනීමට සහ ප්‍රාදේශීය හා ජාතික මට්ටමින් හැකි ඉක්මනින් නඩු අවසන් කිරීමට ප්‍රාදේශීය නියෝජිතායතන විසින් ගැලපෙන, අවදානම් මත පදනම් වූ ප්‍රතිචාර ලබා දීම සහතික කිරීමෙන් අතුරුදහන් වූවන්ට හානි වීමේ අවදානම අඩු කිරීම.

ප්‍රතිසාදන හෝ ප්‍රතිකර්ම විකල්ප -ඉක්මන් ප්‍රතිචාර දැක්වීම සහ සහය වෙත පිවිසීමේ ආකාරය පවුල් වෙත අවබෝධ කරවීම තහවුරු කිරීමෙන් අතුරුදහන් වූ පුද්ගලයන්ට සහ ඔවුන්ගේ පවුල්වලට සහය සහ මඟපෙන්වීම ලබා දීම

2021 සඳහා වන වාර්ෂික සැලැස්මට පගත සඳහන් සංරචක ඇති අතර අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය, රජය නියෝජනය කරන ඕයලුම පාර්ශවකරුවන් සහ අලුතින් පිහිටුවන ලද සමඟි පර්ෂදය, සිවිල් සමාජය, දායක ප්‍රජාව සහ රාජ්‍යතාන්ත්‍රික ප්‍රජාව සමඟ සහයෝගයෙන් කටයුතු කරයි.

7.1 චින්දිත සහ පවුල් සහය

චින්දිත සහ පවුල් සහය ඒකකයේ මූලික කාර්යයන් වන්නේ පැමිණිලි ලබාගැනීම හා ඒ බව දැන්වීම, වෙනත් ඒකක/ ආයතන, ප්‍රජා සම්බන්ධතා, විශේෂිත මනෝ සමාජයීය ආරක්ෂණය සඳහා යොමු කිරීම වෙත යොමු කිරීමට පවුල් සමඟ සම්බන්ධතා පැවැත්වීම, අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය විසින් සපයන අතුරුකාලීන සහන නිර්දේශ පසුවිපරම් කිරීම, හානිපූර්ණය හා කාර්ය මණ්ඩල පුහුණුව සහ අවස්ථා කළමනාකරණය යි.

7.2 ආරක්ෂාව

අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය අනුව "ආරක්ෂණ ඒකකය චින්දිනයින්, සාක්ෂිකරුවන් සහ අතුරුදහන් වූ පුද්ගලයන්ගේ ඥාතීන්ගේ ගැටළු සහ අවශ්‍යතා සම්බන්ධව කටයුතු කරමින් අයිතීන් ආරක්ෂා කළ යුතු ය"[1] ඒකකය, අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ අධ්‍යක්ෂ මණ්ඩලය, කාර්ය මණ්ඩලය, පරිශ්‍රය සහ අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය සමඟ කටයුතු කරන ක්‍රියාධරයන්ගේ ආරක්ෂාව තහවුරු කිරීම සඳහා වගකියනු ලබයි. ආරක්ෂණ ඒකකය විසින් සිදු කරනු ලබන කාර්යයන් වන්නේ සිදුවීම්, සංවර්ධනය කෙරෙන ප්‍රොටොකෝල, ප්‍රමිති මෙහෙයුම් ක්‍රියා පටිපාටි ලේඛනගත කිරීම, නිරීක්ෂුම් වගුවක් භාවිතයෙන් අතුරුදහන් වීමේ නව පැමිණිලි අධීක්ෂණය, උපාය මාර්ග, පසුවිපරම් ආරක්ෂණ ක්‍රියාමාර්ග සහ පුහුණු හා සමාලෝචන ක්‍රියා පටිපාටි අධීක්ෂණයයි.

---

[1] 2016 අංක 14 දරන අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාල පනත, 18(1) වගන්තිය. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාල පනත

7.3 නෛතික සහ ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ

අතුරුදහන් වූ කැනැත්තන් පිළිබඳ කාර්යාලයට අතුරුදහන් වූවන්ගේ සහ ඔවුන්ගේ ඥාතීන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට සහ අතුරුදහන් වූවන්ගේ පවුල් සඳහා ආර්ථික, මනෝ සමාජීය, නෛතික සහ පරිපාලනමය සහය ලබා ගැනීමට පහසුකම් සැලසීමේ විධි නියෝගයක් ඇත.[6] එමෙන්ම, අතුරුදහන් වීම් නැවත සිදු නොවන බව තහවුරු කිරීම පිණිස රාජ්‍ය බලධාරීන්ට නිර්දේශ ඉදිරිපත් කිරීමට, මිනිස් අවශේෂ සම්බන්ධව කටයුතු කිරීමට සහ අතුරුදහන් වූවන්ගේ සහ ඔවුන්ගේ ඥාතීන්ගේ සමාජ සහ ආර්ථික තත්ත්වයන් සංවර්ධනය කිරීමට බලය ඇත.[7] ඉහත විධිනියෝගය ක්‍රියාත්මක කිරීමේදී, අතුරුදහන් වූ කැනැත්තන් පිළිබඳ කාර්යාලය දක්නට නොමැති බවට වූ සහතිකය නෛතික සහ ප්‍රතිපත්ති නිර්දේශ සිදු කරයි; දක්නට නොමැති බවට වූ සහතිකය ලබා ගැනීමට හැකිවන පරිදි අතුරුදහන් වූ කැනැත්තන්ගේ පවුල්වලට අතුරු වාර්තා නිකුත් කරයි; 2019 අයවැයෙන් හෝ ඕනෑම ආකාරයකින් ප්‍රකාශයට පත් කර ඇති පරිදි සහන ක්‍රියාමාර්ග වඩා ඵලදායී ක්‍රියාත්මක කිරීම සඳහා කටයුතු කර පෙනී සිටියි; මිනිස් අවශේෂ පිළිබඳ පරීක්ෂණ වලදී මහේස්ත්‍රාත් බලකල හාවිතා කිරීම; අතුරුදහන් වූවන් සහ ඔවුන්ගේ පවුල් සඳහා කොවිඩ සහන ලබා දෙයි; කනි තනි අවස්ථා වලදී නීතිමය සහ පරිපාලන සහය සඳහා වන ඉල්ලීම් වලට ප්‍රතිචාර දක්වයි. නෛතික සහ ප්‍රතිපත්ති ඒකකය ප්‍රධාන වශයෙන් කටයුතු කරන්නේ අන්තර්ක්‍රියාදීන සැලසුම් සහ අධිකරණ නියෝජිතයන් සම්බන්ධයෙන් සහ නෛතික විධි විධාන සම්බන්ධව නීතී වෘත්තිකයන්ට පුහුණුව සහ කාර්ය මණ්ඩලයේ ධාරිතා වර්ධන වැඩසටහන් සිදු කරයි.[8]

7.4 දක්නට නොමැති බවට වූ සහතිකය

2016 අංක 16 දරන මරණ ලියාපදිංචි කිරීමේ (තාවකාලික විධි විධාන) (සංශෝධන) (මරණ ලියාපදිංචි කිරීමේ පනත) මඟින් අතුරුදහන් වූ කැනැත්තන්ගේ පවුල්වලට දක්නට නොමැති බවට වන සහතික නිකුත් කිරීමට බලය ලබා දෙයි. දක්නට නොමැති බවට වූ සහතිකය, අතුරුදහන් වූවන්ට නීත්‍යානුකූල තත්වයක් ලබාදෙන නීත්‍යානුකූල ලේඛනයක් වන අතර මරණ සහතිකයක් නොමැති අවස්ථාවකදී අතුරුදහන් වූවන්ගේ පවුල්වල අයට පරිපාලන සහ මූල්‍ය සේවාවන් හා වෙනත් ප්‍රතිලාභ ලබාගැනීම සඳහා පිවිසිය හැකි වේ. උතුරු සහ නැගෙනහිර දේශපාලන කැලඹිලි නිසා ඇති වූ ගැටුම, ශිවිල් කලකෝලහාල, බලහත්කාරී අතුරුදහන් කිරීම් හේතුවෙන් අතුරුදහන් වූ හෝ යුධ හමුදාවේ හෝ පොලීසියේ සාමාජිකයෙකුව සිට ක්‍රියාන්විතයේදී අතුරුදහන් වූවන් වෙනුවෙන් දක්නට නොමැති බවට වූ සහතිකය නිකුත් කළ හැකිය.

මරණ ලියාපදිංචි කිරීමේ පනත[9] මඟින් දක්නට නොමැති බව පිළිබඳ සහතික නිකුත් කිරීමට අදාළ විධිවිධාන යපයයි. (i) දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරුන් විසින් පවත්වන විමසුම් ක්‍රියාවලියක් හරහා සාමාන්‍ය ක්‍රියාපටිපාටියක් මඟින් හෝ (ii) අතුරුදහන් වූ කැනැත්තන් පිළිබඳ කාර්යාලය විසින් නිකුත් කරන ලද අතුරු වාර්තාවක් මත පදනම්ව[10] හෝ පෙර විමසුම් කොමිෂන් සභාවක (CoI) වාර්තාවක් මත පදනම්ව විශ්තර ක්‍රියා පටිපාටියක් මඟින්. කෙසේ වුවත් මෙම ක්‍රියා පටිපාටීන් දෙක සම්බන්ධව රජයේ නිලධාරීන්ගේ නොදැනුවත් බව සහ පැටලිලි සහගත බව හේතුවෙන් දක්නට නොමැති බව පිළිබඳ සහතික ලබාගැනීමෙදී අදාළ පවුල්වලට අභියෝගයන්ට මුහුණ දීමට සිදුව ඇත.

ආයතනික මට්ටමින්, පවුල් වෙත දක්නට නොමැති බව පිළිබඳ සහතික නිකුත් කිරීමට පහසුකම් සැලසීමට සහ කඩිනම් කිරීමට අතුරුදහන් වූ කැනැත්තන් පිළිබඳ කාර්යාලය රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව සමඟ දිගටම සම්බන්ධ විය. 2019 මැයි මාසයේදී අතුරුදහන් වූ කැනැත්තන් පිළිබඳ කාර්යාලය සහ රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව අතර සහයෝගිතා ලිපියක් අත්සන් කිරීමෙන්, අතුරුදහන් වූ කැනැත්තන් පිළිබඳ කාර්යාලය විසින් සාමාන්‍ය සහ විශේෂ ප්‍රතිපාදන යටතේ දක්නට නොමැති බව පිළිබඳ සහතික නිකුත් කිරීමේ ක්‍රියාවලියේදී දිස්ත්‍රික් සහ සහකාර රෙජිස්ට්‍රාර්වරුන් විසින් අනුගමනය කළ යුතු විස්තරාත්මක ක්‍රියා පටිපාටිය සම්බන්ධයෙන් රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව සඳහා කෙටුම්පත් කරන ලද වක්‍රලේඛය සඳහා නීතිය මඟින් දක්වා ඇති

---

[6] අතුරුදහන් වූ කැනැත්තන් පිළිබඳ කාර්යාල පනත, 2 (අ): 10 (ඇ), 13) (ඉ) (ඊ)වගන්ති.

[7] අතුරුදහන් වූ කැනැත්තන් පිළිබඳ කාර්යාල පනත, 13 වගන්තිය k)(i),(iii),(vii).

[8] කරුණාකර 2021 ක්‍රියාකාරී සැලැස්ම සඳහා ඇමිණුම 11 බලන්න.

[9] මෙම 2016 අංක 16 මරණ ලියාපදිංචි කිරීමේ (තාවකාලික විධිවිධාන) (සංශෝධිත) පනත 8 අ- 8 උ දක්වා වගන්ති

[10] මෙම 2016 අංක 16 මරණ ලියාපදිංචි කිරීමේ (තාවකාලික විධිවිධාන) (සංශෝධිත) පනත 8 අ - 8 උ දක්වා වගන්ති

ප්‍රතිපාදන පිළිබඳව පැහැදිලි කිරීම් ලබා ගැනීමට රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සමඟ අඛණ්ඩව සාකච්ඡා කරන ලදී.[11]

දක්නට නොමැති බව පිළිබඳ සහතික හෝ මරණ සහතික ලබා ගැනීම සම්බන්ධයෙන් අතුරුදහන් වූවන්ගේ පවුල්වලින් ලැබුණු විමසීම් සහ මැදිහත්වීම් සඳහා වන ඉල්ලීම් සම්බන්ධයෙන් අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරුන්, ප්‍රාදේශීය ලේකම් කාර්යාල සහ ග්‍රාම නිලධාරීන් සමඟ දිගටම කටයුතු කළේය.

7.5 අතුරු වාර්තා

පරීක්ෂණයක් පැවැත්වීමට නියමිතව, පැමිණිල්ලක් සම්බන්ධ පුද්ගලයා අතුරුදහන් වූ පුද්ගලයෙකු බව නිගමනය කිරීමට අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය සතුව ප්‍රමාණවත් තොරතුරු නිබේ නම්, අතුරුදහන් වූවන් පිළිබඳ අතුරුදහන් වූවන්ගේ ඥාතීන්ට අතුරු වාර්තා නිකුත් කිරීම අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයට පැවරේ.[12] අතුරු වාර්තාවක එකම අරමුණ වන්නේ රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් අතුරුදහන් වූවෙකුගේ ඥාතියෙකුට දක්නට නොමැති බව පිළිබඳ සහතිකයක් නිකුත් කිරීමට පහසුකම් සැපයීමයි.[13] අතුරු වාර්තා නිකුත් කිරීමේ ක්‍රියාවලිය අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාල පනත[14] සහ මරණ ලියාපදිංචි කිරීමේ පනත[15] මඟින් නියම කර ඇති පරිදි 2019 වසරේදී අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය විසින් ප්‍රතිපත්ති, ක්‍රියා පටිපාටි, රීති සහ මාර්ගෝපදේශ සහිතව සකසන ලදී. 2020 ජනවාරි මස සිදු කළ නියමුව් විමසුම් ක්‍රියාවලියෙන් පසු 2020 වසරේදී අතුරුදහන් වූ පුද්ගලයෙකුගේ ඥාතීන්ට පළමු අතුරු වාර්තාව නිකුත් කරන ලදී. 2021 වසරේදී අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය විසින් විවිධ ස්ථානවල පැවැත්වූ විමර්ශනවලින් පසුව අතුරු වාර්තා 67 ක් නිකුත් කරන ලදී.

වාර්තාකරණ වසර තුළ ප්‍රාදේශීය වශයෙන් සිදු කළ අතුරු වාර්තා විමසුම්:

මාතර	01,
මන්නාරම	42 ,
යාපනය	24
මඩකලපුව	00
කිලිනොච්චිය	
(2021 අගෝස්තු 31 වැනිදා)	00

7.6 දත්ත කළමනාකරණය

බලධාරීන් සමඟ ඵලදායී සහ කාර්යක්ෂම සහභාගීත්වයක් සඳහා අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය, පනත මඟින් ලබා දී ඇති විධි විධාන සමඟ 2021 වසරේදී විශ්ලේෂණ දත්ත කළමනාකරණ පද්ධතියක් නිර්මාණය කළ අතර පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් ජනරාල්, හානිපූරණ කාර්යාලය සහ ජාතික ඒකාබද්ධතා සහ සංහිඳියා කාර්යාලය වැනි අධිකාරීන් සමඟ එකතුව එම පද්ධතිය වැඩි දියුණු කළේ ය.

7.7 සමගි පර්ෂදය

සමගි පර්ෂදය යනු ශ්‍රී ලංකාවේ පශ්චාත් යුද සංහිඳියාව සම්බන්ධයෙන් සංවේදීව ක්‍රියා කිරීම සඳහා අධිකරණ අමාත්‍යාංශය සහ විදේශ කටයුතු අමාත්‍යාංශය විසින් ජනනය කරන ලද අදහසකි. සමගි පර්ෂදය, හානිපූරණ කාර්යාලය, ජාතික සමගිය සහ ප්‍රතිසංධානය සඳහා වන කාර්යාලය, ශ්‍රී ලංකා නිරෝධ සංවර්ධන අධ්‍යක්ෂ මණ්ඩලය සහ අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය මඟින් සමන්විත වෙයි. පර්ෂදය, ප්‍රගතිය

[11] මෙම 2016 අංක 16 මරණ ලියාපදිංචි කිරීමේ (තාවකාලික විධිවිධාන) (සංශෝධන) පනත 8 අ - 8 උ දක්වා වගන්ති

[12] 2016 අංක 14 දරන අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාල පනත, 13(1)(a)(i) වගන්තිය.

[13] 2016 අංක 16 දරන මරණ ලියාපදිංචි කිරීමේ (තාවකාලික විධි විධාන) සංශෝධන) පනත මඟින් රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් දක්නට නොමැති බව පිළිබඳ සහතික නිකුත් කිරීමට අවසර ලබා දෙන වෙනත් එවැනි නීතියක්.

[14] 2016 අංක 14 දරන අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාල පනත, 13(1)(a)(i) වගන්තිය.

[15] 2016 අංක 16 මරණ ලියාපදිංචි කිරීමේ (තාවකාලික විධිවිධාන) (සංශෝධන) පනත

සමාලෝචනය කිරීමට මාසිකව රැස්වන අතර අමාත්‍යාංශය කාර්තුවකදී එක් වරක් හමුවේ. එමෙන්ම එය විදේශ අමාත්‍යාංශයේ ඉල්ලීම මත කොළඹ විදේශ දූත මණ්ඩල, සිවිල් සමාජය සහ සංවර්ධන හවුල්කරුවන් හමු වීය. 2021 දෙසැම්බර් මස වන විට අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය සමඟ පර්ෂද රැස්වීම් 5 කට පමණ සහභාගි වූ අතර සහයෝගී ක්‍රියාකාරකම්වල ප්‍රගතිය අභියෝග සහ නව මූලාරම්භයන් බෙදා හදා ගත්තේ ය.

8. 2021 ප්‍රධාන වැඩසටහන්:

අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය 2021 වසර සඳහා 2020 වසරේදී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සංවර්ධනය කර අනුමත කරන ලද වාර්ෂික වැඩ සැලැස්මෙන් මාර්ගෝපදේශය ලබා ගත්තේ ය. 2021 වසරේ ප්‍රධාන වැඩසටහන් පහත පරිදි විය. කම වගකීම් ඉටු කිරීමේදී එක් අභියෝගයකට වඩා වැඩි ප්‍රමාණයක් ඇති වූ බව සහ කොවිඩ 19 වසංගතය හේතුවෙන් පැනවූ සංචරණ සීමාවන් සහ වසා දැමීම් ප්‍රධාන අභියෝග වූ බව අවධාරණය කරයි. අධ්‍යක්ෂ මණ්ඩලය සහ කාර්ය මණ්ඩලය, කර්තව්‍යයන්, ප්‍රතිපත්ති සහ රීති ප්‍රධාන ධාරාගත කිරීමට යම් කාලයක් ගත් අතර අවම ගමනාගමනය හා කාර්යාලයට වාර්තා කිරීමේ අවශ්‍යතාවය අවම වීම හේතුවෙන් දත්ත කළමණාකරනය, ක්‍රියාවලි, ප්‍රතිපත්ති හා නීති සඳහා 2021 වර්ෂයේදී ප්‍රමුඛතාවය ලබා දෙන ලදී.

8.1 චින්දිත සහ පවුල් සහාය

චින්දිත සහ පවුල් සහාය ඒකකය පැමිණිලි ලැබීම සහ පිළිගැනීම, චින්දිත පවුල් සමඟ සන්නිවේදනය සහ යොමු කිරීම, බෙදා හැරීම, දැනුවත් කිරීම, මනෝ සමාජීය සහාය, අතුරු සෙවන, වන්දි ගෙවීම, අනුස්මරණ සේවා සහ කාර්ය මණ්ඩල සංවර්ධනය සම්බන්ධයෙන් කටයුතු කරයි. අයවැය ප්‍රතිපාදනවලින් සැලකිය යුතු කොටසක් කොමිෂන් සභාවේ මෙම කාර්යය සඳහා කැප කෙරේ.

i. පැමිණිලි ගම්බාන්ධව කටයුතු කිරීම

වාර්තාකරණ කාල සීමාව තුළ අත්විඳින ලද සංචරණ සීමාවන් හේතුවෙන් අභ්‍යන්තර මෙහෙයුම් සඳහා වැඩි අවධානයක් යොමු කෙරේ. කෙසේ වෙතත්, එම කාලය තුළ නිම නොවූ පැමිණිලි අවසන් කළ අතර නව පැමිණිලිකරුවන් වෙත යොමු විය. 2021 වර්ෂය තුළ නව පැමිණිලි 56ක් ලැබී ඇති අතර වාර්තාකරණ කාලය තුළ ලැබුණු පැරණි පැමිණිලි ඇතුළුව පැමිණිලි 10,592ක් පිළිගෙන ඇත. වාර්තාකරණ කාලය තුළ අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයට ප්‍රාදේශීය වශයෙන් පැමිණිලි 1354 ක් ලැබිණි (අම්පාර, නිකුණාමලය, මුලතිව්, වවුනියාව, මඩකලපුව, කිලිනොච්චිය).

අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය අදියර 1 තුළදී සියලුම ලේඛන නැවත කියවා ඒවා ප්‍රමුඛතාව අනුව සැකසීමට මූලික අදියර තුනකට වර්ගීකරණය කරන ලදී. ප්‍රමුඛතාවයේ පළමු අදියර 2000-2021 වසර අතර පැමිණිලිවලින් ද, දෙවන අදියර 1999 සිට 1991 දක්වා වූ පැමිණිලිවලින්ද, තුන්වන අදියර 1990 වසරට පෙර පැමිණිලිවලින්ද සමන්විත වේ. එය අතුරුදහන් වූ බවට වන වාර්තාවේ දිනය, ස්ත්‍රී පුරුෂ භාවය, ස්ථානය, සිද්ධියේ ස්වභාවය සහ අතුරුදහන් වූ පුද්ගලයාගේ පරිපාලන දිස්ත්‍රික්කය මත පදනම්ව සංඛ්‍යා තක්සේරු කරයි.

පහත සඳහන් ප්‍රධාන කරුණු තුන අනුව අදියර 1 ලෙස අයදුම් පත්‍ර/ ගොනු 6025 ක වාර්තා ඇගයීමට ක්‍රියාවලිය සකසා ගැනීමට අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය තීරණය කරන ලදී;

(i) ඉතා මෑතක දී සිදු වූ අතුරුදහන් වීම සම්බන්ධ සිදුවීම;
(ii) සැලකිය යුතු සාක්ෂි දැනටමත් ලබා ගත හැකි සිදුවීම්; හෝ
(iii) අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ මතය අනුව මහජනතාවට වැදගත් වන ලෙස සැලකෙන සිදුවීම

මෙම කාල සීමාව තුළ ලැබුණු පැමිණිලි 6025 ක් වර්ගීකරණය කරන ලද අතර අයදුම්කරුවන්ගේ විස්තර, සිදුවීම හා සම්බන්ධ සාධක, සිදුවීමෙන් පසු අයදුම්කරු විසින් සිදු කළ දේ සහ අයදුම්කරු හා අතුරුදහන් වූ පුද්ගලයා අතර සම්බන්ධතාව යනාදිය ඇතුළත් පිරික්සුම් ලැයිස්තුවක් තුළින් ලේඛන කඟවුරු කරගෙන ඇත. පැමිණිලි

6025 අතුරින්, අයදුම්පත් 1600 ක් අසම්පූර්ණ වූ බැවින් අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය, අතුරුදහන් වීම පිළිබඳ තොරතුරු සහ පැමිණිල්ල හා සම්බන්ධ සාධක පිළිබඳ නිරණය ගැනීමට සහය වන ලේඛන ලබාගැනීමට පැමිණිලිකරුවන් සමඟ සන්නිවේදනය කළේ ය.

වාර්තාකරණ කාලය පැමිණිලි 350 ක් පරිවර්තනය කර ඇති අතර, අතුරු වාර්තා විමර්ශනා ක්‍රියාවලිය ඇගයීම මෙම වන විටත් ආරම්භ කර ඇත. මෙයට, අතුරු වාර්තා නිකුත් කළ පැමිණිලි 68 ක් ඇතුළත් වේ.

b. පවුල් සම්මා සන්නිවේදනය

කොවිඩ් ආංවරණ සීමා නිසියදීත් යොමු තොරතුරු ගැටළු, නීතිමය ගැටළු සහ නිරීක්ෂණ ගැටළු සම්බන්ධව පවුල් බොහොමයක් අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය සමඟ සන්නිවේදනය කළේ ය. එහෙත් 2020 වසරට සාපේක්ෂව සංඛ්‍යාව සැලකිය යුතු ලෙස අඩු විය. 2020 වසර තුළ අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ ප්‍රාදේශීය කාර්යාල පවුල් 1991 ක් සමඟ සන්නිවේදනය කළ අතර පවුල් 35 ක් පමණක් අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය සමඟ සන්නිවේදනය කළේ ය. 2021 වසර තුළ ප්‍රධාන කාර්යාලය සහ ප්‍රාදේශීය කාර්යාල සමඟ පවුල් 16 ක් සම්බන්ධතා පැවැත්විය.

c. ප්‍රජා සම්බන්ධතා

මෙම කාලය තුළ පැවති සංවරණ සීමා හේතුවෙන් ප්‍රජා සම්බන්ධතා පැවැත්වීම අභියෝගයක් වූ අතර ඒ වෙනුවට මූලික වැඩකටයුතු සිදු කරනු ලැබීය. පැමිණිලි හැසිරවීමේ ක්‍රියාවලිය හා අනුකූල පියවරෙන් පියවර මාර්ගෝපදේශය, හරස් සත්‍යාපනය සඳහා වන පිරික්සුම් ලැයිස්තුව හා රජයේ නිලධාරීන් ඉලක්ක කරගත් පුහුණු ලේඛන මෙම කාල සීමාව තුළ සංවර්ධනය කෙරිණි. රාජ්‍ය සේවා සහ පරිපාලන අමාත්‍යාංශයට අනුයුක්ත දිස්ත්‍රික් ලේකම්වරුන් 25 දෙනෙකු සහ නිලධාරීන් 30 දෙනෙකු අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ කාර්යයන් සහ එහි කටයුතුවලදී නිලධාරීන්ට සහය විය හැකි ආකාරය සම්බන්ධව අවධානය යොමු කරන ලදී. මීට අමතරව, දත්ත ආකෘති පත්‍ර සහ අතුරු වාර්තා ඉල්ලුම්පත්‍ර 2,000ක් මුද්‍රණය කර ප්‍රාදේශීය කාර්යාලවලදී ලබාගත හැකි පරිදි තබා ඇත.

d. යොමු පද්ධතිය

මනෝ-සමාජ සහ සමාජ-ආර්ථික අවශ්‍යතා හඳුනා ගැනීම සඳහා අවශ්‍යතා තක්සේරු අධ්‍යයනයක් සිදු කරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස අවශ්‍යතා ඇගයුම් උපාය මාර්ගික පත්‍රිකාවක් සංවර්ධනය කෙරිණි.

e. හානිපූරණය

විමර්ශනා කාර්යාලය සහ හානිපූරණ කාර්යාලය සමඟ සම්බන්ධීකරණය කර හානිපූරණය සඳහා පැමිණිලි 100 ක් පමණ යොමු කරන ලදී.

8.2 විත්දිනයින් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම

විත්දිනයින් සහ සාක්ෂිකරුවන්ගේ ආරක්ෂාව සංවර්ධනය කිරීමේ සහ බලාත්මක කිරීමේ පද්ධතියක් සංවර්ධනය කිරීමට අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයට විධිනියෝගය ඇත. එය විත්දිකයින් සහ සාක්ෂිකරුවන්ගෙන් පැමිණිලි ලබා ගැනීම සහ වාර්තා කිරීම සඳහා ක්‍රියා පටිපාටි සකස් කරන අතර එහි අතුරු වාර්තාවේ නිර්දේශයන් අනුගමනය කරයි. විත්දිකයින්ට, සාක්ෂිකරුවන්ට සහ අනෙකුත් යුක්තිය පසිඳලීමේ සහකරුවන්ට තර්ජනය කිරීම හෝ බිය ගැන්වීමවලට ලක් වූ සිද්ධීන් වැළැක්වීමට මෙන්ම විමර්ශනය කිරීමට පියවර ගැනීමට අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය විසින් නීතිපතිවරයා, පොලිස්පතිවරයා සහ ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ සහයෝගය ඉල්ලා සිටිය යුතුය. තව ද, ආරක්ෂණ ඒකකයට, විත්දිනයින්, සාක්ෂිකරුවන් සහ අතුරුදහන් වූවන්ගේ පවුල්, අතුරුදහන් වූ තැනත්තන් පිළිබඳ කාර්යාලය හා

සම්බන්ධ වන්නන්; අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ කාර්ය මණ්ඩලය සහ එහි පරිශ්‍රයේ ගැටළු, අවශ්‍යතාවන් සම්බන්ධව කටයුතු කිරීමේ සහ ඔවුන්ගේ අයිතීන් ආරක්ෂා කිරීමේ වගකීම පැවරී ඇත.

අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ චින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීමේ ක්‍රියාකාරකම් සහතික කිරීම සඳහා, ඒකකය විසින් පැමිණිලි 2ක නිරීක්ෂණ වශ යාවත්කාලීන කර, උපදේශන 11ක් සිදු කර ඇති අතර 2021 දී සිද්ධීන් 69ක් පිළිබඳ තොරතුරු බෙදාගෙන ඇත. පරීක්ෂණ පැවැත්වීම පිළිබඳ පුහුණුව ලබන පුද්ගලයින් 121 දෙනෙකුට අවස්ථා 4ක් ලබාදීම තුළින් මෙම ඒකකය ධාරිතාවයන් ගොඩනඟා ගන්නා ලදී. පුහුණු නිලධාරීන් විසින් විමර්ශන සිදු කර පැමිණිලි 11 ක් අදාළ ආයතන වෙත යොමු කරන ලදී. මීට අමතරව, සියලුම දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි අවස්ථා 3ක් හරහා උපදේශන සිදු කර 2021 දී පුද්ගලයින් 171 දෙනෙකු වෙත ළඟා විය. එමෙන්ම, නිලධාරීන් 184 ක් වෙත ළඟා වෙමින් උපදේශන කුන සිදු කරන ලදී. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය පැමිණිලි 27 ක් සම්බන්ධව පසුවිපරම් කළ අතර නිරීක්ෂණ වශුව සංවර්ධනය කර විස්කර සහිතව වාර්තා සකසන ලදී.

8.3 නෛතික සහ ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ

අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයට අතුරුදහන් වූවන් සම්බන්ධ නිර්දේශ නිකුත් කිරීමට සහ ඔවුන්ගේ හා ඔවුන්ගේ ඥාතීන්ගේ අයිතීන් ආරක්ෂා කිරීමට කටයුතු කිරීමේ අරමුණක් ඇත. එමෙන්ම, අතුරුදහන් වූවන්ගේ පවුල්වල අයට මනෝ සමාජීය, නෛතික සහ පරිපාලනමය සහය ලබාගැනීමේ ලා වන ප්‍රවේශයට පහසුකම් සැලසීමේ වගකීමද එයට පැවරී තිබේ. ඉදිරියේදී සිදුවන අතුරුදහන් වීම් වැලැක්වීම, මිනිස් මෘතදේහ සම්බන්ධව කටයුතු කිරීම සහ අතුරුදහන් වූ පුද්ගලයන් සහ ඔවුන්ගේ පවුල්වල සමාජ සහ ආර්ථික තත්වයන් වැඩි දියුණු කිරීම, ඇතුළු කරුණු ගණනාවක් සම්බන්ධව අනෙකුත් රාජ්‍ය ආයතනවලට නිර්දේශ ඉදිරිපත් කිරීමට අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයට බලය ඇත.

සිවිල් හා හමුදා පවුල් වෙතින් අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය වෙත සහය සඳහා වන ඉල්ලීම් ලැබිණි; එම ඉල්ලීම් අතරට රාජ්‍ය සේවාවන් වෙත පිවිසීම, මූල්‍ය සේවාවන් වන්දි, මරණ සහතික සහ විශ්‍රාම වැටුප් ලබාගැනීම, දක්නට නොමැති බව පිළිබඳ සහතික ලබා ගැනීම, පවතින නඩු, වක්කම් පිළිබඳ මතභේද, උරුමය සහ අනුප්‍රාප්තිය වීම යනාදී ඉල්ලීම් , ඇතුළත් විය. හානිපූරණ කාර්යාලය, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව, පළාත් පාලන ආයතන සහ ත්‍රිවිධ හමුදාව, ඇතුළු අදාළ රාජ්‍ය ආයතන සමඟ එවැනි කරුණු සාකච්ඡා කිරීමෙන් අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය ප්‍රතිචාර දැක්වූවේ ය. නීති උපදෙස්, ප්‍රායෝගික මග පෙන්වීම, සහ යොමු කිරීම් කරමින් අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය පවුල් සඳහා සහාය විය.

අතුරුදහන් වූවන්ගේ පවුල් වලින් ලද විමසීම් අනුව අදාළ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරුන්, ප්‍රාදේශීය ලේකම් කාර්යාල සහ ග්‍රාම නිලධාරීන්ගේ මැදිහත් වීමෙන් දක්නට නොමැති බව පිළිබඳ සහතික හෝ මරණ සහතික ලබා ගැනීම සඳහා එක් එක් අවස්ථාවලදී අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය පවුල් වෙත සහාය විය.

ලබා ඇති විධිනියෝග අනුව අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය අතුරු වාර්තා 385 ක් සකාර කර නිර්දේශ නිකුත් කළ අතර දක්ත පදනමේ විස්තර යාවත්කාලීන කර ගොනු 3100 ක ප්‍රගතිය දක්ත ගබඩාවට ඇතුළත් කරන ලදී. මීට අමතරව, අදාළ අධිකරණයන් වෙත අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය විසින් ඉදිරිපත් කරන ලද අයුතුපත්‍ර අනුව අධිකරණ ක්‍රියාවලීන් තුළ නිරීක්ෂකයෙකු ලෙස කටයුතු කිරීමට සහ ස්ථාන හෝ තුළ හමු වූ මිනිස් මෘතදේහ සම්බන්ධව විමර්ශන කටයුතු කිරීමට අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයට අවසර ලැබිණි. වාර්තාකරණ කාලය තුළ අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය විමර්ශනවල සහ අධිකරණයේ නඩුවල ප්‍රගතිය පසු විපරම් කළ අතර අවශ්‍ය අවස්ථාවලදී පවුල්වලට සහය ලබාදෙන ලදී. එමෙන්ම, නීති සහ ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ ඒකකයේ නියෝජිතයෝ අධිකරණයේ නඩු 13 කට ඉදිරිපත් වූ අතර නඩුවලට අදාළ සිද්ධි වාර්තා සහ නීතිඥ වාර්තා ඉදිරිපත් කළහ.

2021 වසරේදී නීති සහ ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ ඒකකය, නීතිඥයින් සහ කාර්ය මණ්ඩලය/ අධිකරණ නිලධාරීන් කැඳීම, අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද අධිකරණ වෛද්‍ය සහ ඩීඑන්(DNA) ශිල්ප ක්‍රම සම්බන්ධව පුහුණු කිරීම සඳහා හඳුනා කළ හැකි පුහුණු මොඩියුල කුනක්

(03) සංවර්ධනය කරන ලදී. එමෙන්ම ඒකකය විසින් කාර්ය මණ්ඩල සාමාජිකයින් 11 දෙනෙකුට පුහුණු සැසි දෙකකදී රහස්‍යතාවය සහ වෙනත් අදාළ නීති ප්‍රතිපාදන සම්බන්ධව ධාරිතා සංවර්ධනය සිදු කළ අතර එක් පුහුණු සැසියක් තුළින් කාර්ය මණ්ඩල සාමාජිකයින් 15 දෙනෙකුට කාක්ෂණික සහ වෙනත් නිපුණතා පුහුණුව ලබා දෙන ලදී.

8.4 දත්ත කළමනාකරණය

අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයට, අතුරුදහන් වූවන් පිළිබඳ පැමිණිලි ලබාගැනීමට, දත්ත තුලනය කිරීමට සහ ඔවුන්ගේ තොරතුරු සහිත දත්ත පදනමක් ඇති කිරීමට බලය ඇත.[16] ඒ අනුව, අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය, මූලාශ්‍රයන් ගණනාවක් වෙතින් ලබාගන්නා මෙම තොරතුරු සැකසීම, ඝනාර කිරීම සහ ඇතුළත් කිරීම අබණ්ඩව සිදු කරනා ලදී. ඒ සා සමගාමීව අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය පවුල් සමඟ සන්නිවේදනය කරමින් තමන්ට අදාළ තොරතුරු ලැබුණු බව තහවුරු කිරීම ද සිදු කළේ ය. එමෙන්ම,පළමු වරට පුද්ගලයන් අතුරුදහන් වීමේ අවස්ථාවලට සම්බන්ධ තොරතුරු එක් රැස් කර අතුරුදහන් වූ හා දක්නට නොමැති පුද්ගලයන් පිළිබඳ පැමිණිලි සහ තොරතුරු ලැයිස්තුවක් පළ කිරීමෙන් එය මහජනතාව අතරට ගෙන යන ලදී.[17]

අ. අතුරුදහන් වූවන් සම්බන්ධ පවත්නා දත්ත එක්රැස් කිරීම

අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ එක් අරමුණක් වන්නේ පනතේ 10 (1) (ඉ) වගන්තිය යටතේ දැනට සිදුකෙරෙන ක්‍රියාවලීන් හෝ වෙනත් ආයතන, සංවිධාන, රාජ්‍ය දෙපාර්තමේන්තු, විමසුම් කොමිෂන් සභා සහ විශේෂ ජනාධිපති විමසුම් කොමිෂන් සභා මඟින් ලබාගන්නා අතුරුදහන් වූවන් පිළිබඳ දත්ත එක් රැස් කිරීමත් ඒවා අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය යටතේ ස්ථාපිත දත්ත පදනමක් තුළ මධ්‍යගත කිරීමක්ය. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය ස්ථාපිත, කිරීමේ සිට එය ත්‍රිවිධ හමුදාව සහ පොලිසිය, වෙනත් රාජ්‍ය ආයතන, රාජ්‍ය නොවන සංවිධාන සහ බලහත්කාරී අතුරුදහන් කිරීම පිළිබඳ එක්සත් ජාතීන්ගේ ක්‍රියාකාරී කණ්ඩායම (UNWGIED) වෙතින් තොරතුරු ලබාගෙන තුලනය කර ඇත.

සියලුම දිශ්ත්‍රික්ක ආවරණය කරමින් ප්‍රතිපෝෂණ දත්ත පත්‍රිකා 14,70018 ක් 2018 මාර්තු 15 වනදා අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය වෙත භාරදුන් අතර 2021 වසර තුළදී ගොනු සම්බන්ධව කටයුතු කරන ලදී. අතුරුදහන් වූ පුද්ගලයන් සම්බන්ධ වැදගත් වාර්තා මූලාශ්‍රයක් වන්නේ පසුගිය විමසුම් කොමිෂන් සභා ය. අතුරුදහන් වූ පුද්ගලයන් පිළිබඳ විමසුම් කොමිෂන් සභා නවයක් සමඟ පැවති අතර,19 එයින් කිහිපයක්ම ප්‍රසිද්ධ වාර්තා පළ කර ඇත, නවත් කිහිපයක අවසන් වාර්තා පළ කිරීම ප්‍රමාද වී ඇත. ඒවාට හේතු වන්නේ කාර්ය මණ්ඩලය අඩුවීම සහ කොවිඩ් හේතුවෙන් රට වසා දැමීම මත ඇතිවූ අභියෝගයන් ය.

---

[16]අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාල පනත, 10 (1) (ඉ) වගන්තිය.

[17] අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය, "අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ ප්‍රකාශන" http://www.ompsrilanka.org/omp-documents/omp-publications 2020 දෙසැම්බර් 12 දින පිවිසිණි.

[18]MNIR වෙතින් ලිපිගොනු 14,641 ක් අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයට ලැබී ඇති බව 2018 වාර්ෂික වාර්තාවේ 3.16 ඡේදයේ දැක්වෙයි. කෙසේ වෙතත්, අන්තර්ගතය සමාලෝචනය කිරීමෙන් පසුව සහ ගොනු ගණන නැවත ගණනය කිරීමෙන් පසුව එම අගය 14,700 දක්වා ඉහළ ගියේය.

[19]විමසුම් කොමිෂන් සභා නවය පහත පරිදි වේ: 2913 දී ස්ථාපිත කරන ලද අතුරුදහන් වූ තැනැත්තන් සම්බන්ධ පැමිණිලි විමර්ශනය කිරීම සඳහා වූ ජනාධිපති කොමිසම (පරණගම කොමිසම ලෙසද හැඳින්වේ; 2011 දී ස්ථාපිත උගත් පාඩම් සහ සංහිඳියා කොමිසම; 2006 දී ස්ථාපිත කළු දිවයින පුරා සිදුවන පැහැර ගැනීම්, අතුරුදහන් වීම් සහ සිවිල් වැසියන්ට මරණය ඇති කරන පහරදීම් පිළිබඳ ජනාධිපති විමසුම් කොමිසම (මහානාම සිල්කරත්න කොමිසම ලෙස ද හැඳින්වේ); 1998 දී ස්ථාපිත පුද්ගලයන් අකමැත්තෙන් ඉවත් කිරීම සහ අතුරුදහන් වීම පිළිබඳ ජනාධිපති විමසුම් කොමිසම (සමස්ත ලංකා කොමිසම ලෙස ද හැඳින්වේ) 1995 දී ස්ථාපිත අතුරුදහන් කිරීම්, නීති විරෝධී අත් අඩංගුවට ගැනීම් සහ බවලන්ද නිවාස යෝජනා ක්‍රමයේ රැඳවුම් කඳවුරක් පවත්වාගෙන යාම පිළිබඳ විමර්ශනය සඳහා වූ ජනාධිපති කොමිසම; මධ්‍යම, වයඹ, උතුරුමැද සහ ඌව පළාත්වල පුද්ගලයන් අකමැත්තෙන් ඉවත් කිරීම සහ අතුරුදහන් කිරීම පිළිබඳ ජනාධිපති විමසුම් කොමිසම (1994 දී ස්ථාපිත); 1994 දී ස්ථාපිත බස්නාහිර, දකුණ සහ සබරගමුව පළාත්වල පුද්ගලයන් අකමැත්තෙන් ඉවත් කිරීම සහ අතුරුදහන් කිරීම පිළිබඳ ජනාධිපති විමසුම් කොමිසම; 1991 දී ස්ථාපිත පුද්ගලයන් අකමැත්තෙන් ඉවත් කිරීම සහ අතුරුදහන් කිරීම පිළිබඳ ජනාධිපති විමසුම් කොමිසම, 1992 දී සහ 1993 දී තවි නියෝග නිකුත් කෙරිණි.

අතුරුදහන් වූ සහ අතුරුදහන් වූවන්ගේ, ස්වේච්ඡාවෙන් ඉවත් කිරීම සහ අතුරුදහන් වීම සම්බන්ධව විමසුම් කොමිෂන් සභා වාර්තා ජනාධිපති මුද්‍රාව යටතේ ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ (DNA) වසර කිහිපක කාලයක් සඳහා ගබඩා කර ඇත. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ 2019 වාර්ෂික වාර්තාව තුළ දැක්වූ පරිදි හිටපු ජනාධිපති ලේකම්වරුන්ගෙන්, අතීත විමසුම් කොමිෂන් සභාවල වාර්තාවලට පිවිසීම සඳහා අනුමැතිය් ලබාගන්නා ලදී.20 2019 මැයි 24 දිනැති ලිපියක් මගින් ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව අයත්වන, නිවාස, ඉඩකිරීම් හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය, මෙම ව්‍යාපෘතිය ඉදිරියට ගෙන යන ලෙස ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව වෙත තවදුරටත් උපදෙස් ලබා දෙනු ලැබිණි. මෙම අනුමත කිරීම් වලට අනුව, අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය 2019 ජූලි 22 දින DNA සමග අවබෝධතා ගිවිසුමකට එළඹිණි. කෙසේ වෙතත්, ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව වෙතින් 2021 නිසි පැහැදිලි කිරීමක් නොලැබුණු බැවින් අවබෝධතා ගිවිසුම ක්‍රියාත්මක කිරීමට අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයට හැකියාවක් නොලැබිණි.

අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ ඉල්ලීම්වලට ප්‍රතිචාර දක්වමින්, ක්‍රියාත්විතයේදී අතුරුදන් වූ ශුද්ධ කාර්ය මණ්ඩලයේ නම් ලැයිස්තුවක් ත්‍රිවිධ හමුදාව විසින් ලබා දෙන ලදී. ක්‍රියාත්විතයේදී අතුරුදහන් වූවන් පිළිබඳ ලැයිස්තුව ශ්‍රී ලංකා පොලිසිය වෙතින් තවමත් ලැබී නැත. කෙසේ වෙතත්, ශ්‍රී ලංකා පොලිසිය වෙත අතුරුදහන් වූ බවට වාර්තා කරන ලද නම් ලැයිස්තු අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයට ලැබිණි.

අතුරුදහන් වූවන් සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවෙන් ලැබී ඇති සියලුම වාර්තා WGIED විසින් විදේශ කටයුතු අමාත්‍යාංශයට ඉදිරිපත් කර තිබේ. 2019 වසරේදී විදේශ කටයුතු අමාත්‍යාංශය අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයට අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ පැමිණිලි 12,664 ක් යොමු කළ අතර එහි පැහැදිලි නොකළ වාර්තා 6,066 ක් සහ පැහැදිලි වාර්තා 6,598 ක් ඇතුළත් විය.21අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය එක්සත් ජාතීන්ගේ ක්‍රියාකාරී කණ්ඩායමේ පැමිණිලි 6,538 ක් ද සම්පාදනය කළ අතර 2021 වසරේදී එම කණ්ඩායමේ ඉල්ලීම මත වාර්තා 1,044 ක් සිළියෙළ කළේ ය.

2021 නොවැම්බර් මාසයේදී අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය කිලිනොච්චිය, යාපනය සහ මන්නාරමේ පවුල් 96 කට විමසුම් ලිපි යැවූ අතර ඉන් 81 ක් ප්‍රතිචාර දැක්වූහ. දෙසැම්බර් 17 වන දින කොළඹ සහ මාතර පවුල් 17 කට ලිපි යැවූ අතර ඉන් 14 කට ප්‍රතිචාර ලැබිණි.

ඒ.ඒ. පැමිණිලි

අතුරුදහන් වූ පුද්ගලයෙකු සම්බන්ධ පැමිණිල්ලක්, එම පුද්ගලයාගේ ඥාතියෙකුගෙන්, වෙනත් පුද්ගලයෙකුගෙන් හෝ සංවිධානයකින් ලැබීමට අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයට බලය ඇත.22 අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ ප්‍රධාන කාර්යාලය සහ ප්‍රාදේශීය කාර්යාල වෙත 2021 දෙසැම්බර් 31 දින වන විට අතුරුදහන් වූ පුද්ගලයින් පිළිබඳ පැමිණිලි 2,787 ලැබී තිබේ. මෙයට 2021 ජනවාරි සිට දෙසැම්බර් මාසය දක්වා අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ ප්‍රධාන කාර්යාලයට ලැබුණු ලිපි 56 ක් ද ඇතුළත් වේ. පැමිණිලි 56 න් පැමිණිලිකරුවන් 38ක් දුරකථන මඟින් නව අත්ත විමසා සිටි අතර 16 දෙනෙකු උපදෙස් සඳහා ප්‍රධාන කාර්යාලය වෙත පැමිණියහ. කෙසේ වෙතත්, කොවිඩ් 19 සමග කාර්ය මණ්ඩලය සීමා කිරීම නිසා පැමිණිලි සම්බන්ධ කටයුතු කිරීම ප්‍රමාද විය.

පැමිණිලි විභාග කිරීමේ ක්‍රියා පටිපාටිය අනුව අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය විසින් අතුරුදහන් වූවන්ගේ පවුල් සඳහා ලිඛිත නඟුරු කිරීමක් ලබා දිය යුතු අතර, අතුරුදහන් වූ හෝ අතුරුදහන් වූ පුද්ගලයින් පිළිබඳ තොරතුරු ලැබුණු බව පිළිගත යුතු ය.

---

[20] අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය, වාර්ෂික වාර්තාව (2019), 3.15 - 3.16. ඡේදය (වාර්ෂික වාර්තාව - 2020).

[21] WGIED ට අනුව, අතුරුදහන් වූ පුද්ගලයෙකු පිළිබඳ වාර්තාවකට ප්‍රතිචාර වශයෙන් රජයක් තොරතුරු ඇපයිමට අපොහොසත් වූ විට නඩු "පැහැදිලි නොකළ" ලෙස වර්ගීකරණය කළ යුතු ය. අතුරුදහන් වූ පුද්ගලයෙකුගේ ඉරණම පිළිබඳව රජයක් ප්‍රතිචාරයක් දක්වන විට වාර්තා "පැහැදිලි" ලෙස වර්ගීකරණය කෙරේ.

[22] අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාල පනත, 12 (අ) වගන්තිය.

අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ නියමු අතුරු වාර්තා ව්‍යාපෘතියේ කොටසක් ලෙස, 2021 ජනවාරියේදී, මහනුවර සහ ගම්පහ දිස්ත්‍රික්කයෙන් තෝරාගත් පවුල් සඳහා අතුරු වාර්තා ඉල්ලමින් අයදුම්පත්‍ර 350 ක් පමණ යවා ඇත.

අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය විසින් 2021 දෙසැම්බර් 31 දින වන විට පවුල් වෙත පැමිණිලි ලැබුණු බවට පිළිගැනීමේ ලිපි 10,592 ක් යවා ඇත. කෙසේ වෙතත්, 2021 දී තවත් ලිපි 4,351 ක් යවා නොමැත. මේ සම්බන්ධව කටයුතු කිරීමේදී දෙමළ භාෂාව කරා කරන කාර්ය මණ්ඩලය අඩු වීම විශාල බාධාවක්ව ඇත. ලැබුණු බවට දන්වා යවන ලිපියේ විස්තර පහත දැක්වේ.

දිස්ත්‍රික්කය	ලැබුණු පැමිණිලි ගණන	ලැබුණු බවට දන්වා යැවූ පැමිණිලි ගණන	ලැබුණු බවට දන්වා යැවීමට නියමිත පැමිණිලි ගණන
අම්පාර	566	209	357
අනුරාධපුරය	273	273	00
බදුල්ල	6	6	00
මඩකලපුව	4157	1385	2727
කොළඹ	130	128	02
ගාල්ල	297	297	00
ගම්පහ	261	249	12
හම්බන්තොට	393	393	00
යාපනය	2106	1974	132
කලුතර	190	190	0
මහනුවර	582	582	00
කෑගල්ල	109	109	00
කිලිනොච්චිය	1010	869	141
කුරුණෑගල	387	387	00
මන්නාරම	488	488	00
මාතලේ	292	292	00
මාතර	555	555	00
මොණරාගල	76	51	25
මුලතිවු	528	466	62
නුවරඑළිය	16	14	02
පොළොන්නරුව	343	343	00
පුත්තලම	85	81	04
රත්නපුර	221	221	00
ත්‍රිකුණාමලය	1349	622	727
වවුනියාව	568	408	160
එකතුව	14988	10,592	4,351

අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය එයට ලැබුණු පැමිණිලි අදියර තුනකට වර්ගීකරණය කර ඇත (අදියර 1 - 2020-2021/ අදියර 11 -1999 – 1990 සහ අදියර 111-1990 සිට පසු කාලය). පැමිණිලි 6,086 ක් 2000-2021 අතර කාලය තුළ බවට හඳුනාගෙන ඇත (අදියර 1). පැමිණිලි 6,086 අතුරින්, අසම්පූර්ණ තොරතුරු/ ලේඛන එක් කරගැනීමට අතුරුදහන් වූ තැනැත්තන්ගේ පවුල් වෙත ලිපි 5,300 ක් යවා ඇත. ඉන් 154 ක්, දත්ත පත්‍රිකාවේ සඳහන් කර නොතිබූ අතුරුදහන් වූ දිනය ලබාගැනීමට යැවූ ඒවා විය.

අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ ප්‍රධාන කාර්යාලය වෙත පැමිණි පවුල් ගණන පහත දක්වා ඇත.

මාසය (2021)	ප්‍රධාන කාර්යාලය වෙත පැමිණි පවුල් ගණන
ජනවාරි	05
පෙබරවාරි	-
මාර්තු	-
අප්‍රේල්	04
ජූනි	-
ජූලි	01
අගෝස්තු	-
සැප්තැම්බර්	-
ඔක්තෝබර්	05
නොවැම්බර්	-
දෙසැම්බර්	01
එකතුව	16

ඇ. අතුරුදහන් වූ පුද්ගලයන්ගේ දත්ත ආකෘති පත්‍රය

අතුරුදහන් වූවන්ගේ තොරතුරු රැස් කිරීම සඳහා අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය විසින් භාවිතා කළ අතුරුදහන් වූවන්ගේ දත්ත ආකෘතිය අදියර කිහිපයකට බඳුන් වී ඇත. 2018 දී නියමු ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක කරන ලදුව 2019 ප්‍රතිපෝෂණ මත පදනම්ව යාවත් කරන ලද අතුරුදහන් වූ පුද්ගලයන්ගේ දත්ත ආකෘති පත්‍රය 2020 දී අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද අතර එය වර්තමානයේදී භාවිතා කෙරේ. මෙම ආකෘති පත්‍රය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවලින් ලද හැකි ය. අතුරුදහන් වූ තැනැත්තෙකු පිළිබඳව වාර්තා කිරීමට අවශ්‍ය මෙම අවම තොරතුරු පිළිබඳව ජාත්‍යන්තරව පිළිගත් ප්‍රමිතීන්ට සහ ශ්‍රී ලංකාවට සුවිශේෂී වූ සන්දර්භයන් සහ අවශ්‍යතාවයන්ට අනුකූලව එය සංවර්ධනය කරනු ලැබුවේ ය. එහි ප්‍රතිඵලයක් ලෙස අතුරුදහන් වූවන් පිළිබඳ සරල දත්ත ආකෘති පත්‍රය අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයීය මණ්ඩලය විසින් අනුමත කරනු ලදුව සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවෙන් ලබා දෙන ලදී.

ඈ. දත්ත පදනම

අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාල පනත යටතේ, අතුරුදහන් වූවන් පිළිබඳ[23] සියලු තොරතුරු ඇතුළත් විය යුතු දත්ත සමුදායක් නිර්මාණය කිරීමට, කළමනාකරණය කිරීමට හා නඩත්තු කිරීමට මෙන්ම එහි සියලුම

[23] අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාල පනත, 13 (1) (ඌ) වගන්තිය.

දත්ත පදනම් සහ දත්තවල ආරක්ෂාව තහවුරු කිරීම සඳහා අවශ්‍ය වන සියලුම පියවරයන්, තාක්ෂණික ආරක්ෂාවන්ද ඇතුළුව, ගැනීමට අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලට අධිකාරිය ඇත24.

අතුරුදහන් වූ පුද්ගලයන් සම්බන්ධ තොරතුරු ලැබීමත් සමඟ අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය තම දත්ත පද්ධතියට ඒවා ඇතුළු කිරීමට පෙර සමාලෝචනා ක්‍රියාවලියක නිරත වෙයි. මෙහිදී ලැබුණු තොරතුරුවල නිරවද්‍යතාව සමාලෝචනය කරන අතර අතුරුදහන් වීම මේම කාර්යාලයේ වගකීමට යටත් ක්ෂේත්‍රයකට අයත් වන්නේ ද යන්නත් එය පවතින තොරතුරක් නැවත ඇතුළත් කිරීමක් ද යන්න පරීක්ෂා කෙරේ.

පැමිණිල්ල තුළ සටහන් වන කරුණු අනුව එය අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයට අයත් ක්ෂේත්‍රයක සිදුවීමක් ද, එහි කාලය හා ස්ථානය යනාදී සියල්ල පරීක්ෂාවට බඳුන් වේ. එම අතුරුදහන් වීම අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය හතු වගකීමකට යටත් නොවන්නක් නම්, ඒ පිළිබඳව පැමිණිලිකරුට දන්වා සිටින අතර එයට අදාළ වෙනත් රජයේ ආයතනයක් ඇත්නම් ඒ පිළිබඳව තොරතුරු ලබා දෙනු ලබයි. එවන් අවස්ථාවන්හිදී, එම අතුරුදහන් වීම අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය වග කියන ක්ෂේත්‍රයට අයත් බව තහවුරු කිරීමට පැමිණිලිකරුට අවශ්‍යවා ඇත. අදාළ පැමිණිල්ල සම්බන්ධ තොරතුරු ප්‍රමාණවත් නොවන්නේ නම් සහ ඒ පිළිබඳව තීරණයක් ගත නොහැකි නම් කාර්යාලය විසින් අතුරුදහන් වූ තැනැත්තන්ගේ පවුල්වලින් වැඩි දුර තොරතුරු ඉල්ලා සිටී.

අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය අතුරුදහන් වූ පුද්ගලයන් සම්බන්ධ වාර්තා 39,416 ක් සකසන ලදී. අතුරුදහන් වූවන් පිළිබඳ වාර්තා 21,175 ක් 2021 දෙසැම්බර් 31 දින වන විට අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය සිය දත්ත ගබඩාවට ඇතුළත් කර ඇත. එමෙන්ම, අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය එහි පැමිණිලි අදියර කුනකට වර්ගීකරණය කර ඇති අතර සිදුවීම් 6,086ක් 2000 සහ 2021 අතර (අදියර 1) ලැබුණු බවට හඳුනාගෙන ඇත. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය ආගමන සහ විගමන දෙපාර්තමේන්තුවේ පැමිණිලි 118,000 ක් ද සම්පාදනය කළ අතර සිදුවීම් 93 ක් ගමන් ඉතිහාසය හා සම්බන්ධ බවට හඳුනා ගැණින. හානිපූරණ කාර්යාලය වෙතින් පැමිණිලි දොළොස් දහස් පන්සියයක්(12,500) සම්පාදනය කළ අතර ඒ අතුරින් 760 කට දැනටමත් වන්දි ලැබී ඇති බව අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය හඳුනා ගත්තේය. 2021 වසරේදී අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය දත්ත ඇතුළත් කිරීම වේගවත් කළ අතර කාර්ය මණ්ඩලයේ අඩුව සහ කොවිඩ් 19, සංචරණ සීමා වැනි අභියෝග පවතිද්දී පැමිණිලිවල අවම තොරතුරු සැකසීමට තාවකාලිකව කාර්යමණ්ඩලය යෙදවූයේය.

ඉ. පැමිණිලි ලැයිස්තුව සහ අතුරුදහන් වූ පුද්ගලයන් පිළිබඳ තොරතුරු

රහස්‍යභාවය සහ දත්ත ආරක්ෂා කිරීම සම්බන්ධ අදාළ සියලු නීතිරීති සැලකිල්ලට ගෙන අතුරුදහන් වූවන්ගේ ගැටලු පිළිබඳ මහජනා දැනගැනීම සඳහා තොරතුරු ප්‍රකාශයට පත් කිරීමේ බලය අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයට ඇත.25 කොවිඩ් 19 යටතේ රට වසා දැමීම සහ ගමන් සීමා කිරීම කිහිපයක් නිබු බැවින් ලැබුණු සියලු දත්ත එකතු කිරීමට 2021 වර්ෂය හාවිතා කරන ලදී. මෙම කාල පරිච්ඡේදය තුළ, මූලික අදියරේදී ඉදිරිපත් නොකළ අදාළ තොරතුරු ලබා ගැනීම සඳහා මෙම ඒකකය පවුල් හා සම්බන්ධ විය.

[24]අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාල පනත, 15 (3) වගන්තිය.
[25]අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාල පනත, 13 (1) (k)(v) වගන්තිය

8.5 මානව සම්පත් සහ පරිපාලනය

අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය තම මෙහොලඹ ප්‍රධාන කාර්යාලය මෙන්ම කිලිනොච්චිය, මන්නාරම, යාපනය සහ මඩකලපුව ප්‍රාදේශීය කාර්යාලවල මෙහෙයුම් කටයුතු සම්පූර්ණයෙන්ම සිදු කිරීමට කැප වීමෙන් කටයුතු කළේ ය. ප්‍රාදේශීය කාර්යාල පිහිටුවීම හේතුවෙන් බලපෑමට ලක් වූ දිස්ත්‍රික්කවල පවුල් වෙත පහසුවෙන් ළඟා වීමට අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයට හැකියාව ලැබී ඇත. බලපෑම් ලත් පවුල් සමඟ කටයුතු කිරීමේදී සංවේදීව සහ ඔවුන්ගේ ගරුත්වය රැකෙන පරිදි කටයුතු කිරීමට අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය කැපවී කටයුතු කරයි.

ප්‍රධාන කතිකාවතට පත් වූ සේවක මණ්ඩලය රඳවා නබාගැනීම සැලකිය යුතු අභියෝගයක් වූ අතර විවිධ රීති සහ රෙගුලාසි නිසා අයවැය යටතේ වෙන් කරන ලද අරමුදල් සම්පූර්ණයෙන් ප්‍රයෝජනයට ගැනීමෙහි හැකියාව අඩු වී තිබිණි. මීට අමතරව, 2021 වසරේ කොවිඩ් 19 වසංගතය නිසා ද අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ ආයතනික සංවර්ධන කටයුතුවලට සීමාවන් පැනවිණි.

අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ ස්ථාපිත කිරීම සහ සංවර්ධනය කිරීම සඳහා ජනාධිපති නීතීඥ සාලිය පීරිස් මහතා සහ අධ්‍යක්ෂ මණ්ඩලය නීරණාත්මක කාර්යභාරයක් ඉටු කළහ. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ උපාය මාර්ගික සංවර්ධනය සම්බන්ධව සාකච්ඡා කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය නිරන්තරව රැස්වූ අතර අභියෝග මධ්‍යයේ 2021 වසර තුළ පැවැත්වූ රැස්වීම් ගණන 15 ක් විය. අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ මෙහෙයුම් කටයුතු අධීක්ෂණය කළ අතර ප්‍රධානීන් පත් නොකළ ඒකකවල කටයුතු , හෝ ස්ථාපනය නොකළ ඒකකවල කටයුතු සඳහා කාර්ය මණ්ඩලය සමඟ එක්ව වැඩ කළහ. තවද, මණ්ඩල සාමාජික විමසුම් සිදු කිරීම සහ ක්ෂේත්‍ර චාරිකාවල නියැලුණු අතර පවුල්, සිවිල් සමාජය සහ වෙනත් රාජ්‍ය නිලධාරීන් සමඟ අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ සේවාවන් වැඩි දියුණු කිරීම සම්බන්ධව කටයුතු කළේ ය.

අ. කාර්ය මණ්ඩලය බඳවා ගැනීම

අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය පිහිටුවීමේ දින සිට, එහි කතිකාවතු පිරවීම සඳහා අවශ්‍ය පළපුරුද්දක් ඇති සුදුසුකම් ලත් සේවකයින් බඳවා ගැනීම සඳහා සැලකිය යුතු කාලයක්, ශක්තියක් හා සම්පත් වැය කර ඇත.

අයදුම්පත් සමාලෝචනය කිරීමෙන් පසු සහ අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයෙන් පසු අවශ්‍ය නිපුණතා සහ පළපුරුද්ද ඇති පුද්ගලයින් ආකර්ෂණය කර ගැනීම සඳහා තනතුරු ගණනාවක් නැවත සැලසුම් කළ යුතු බව අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයට අවබෝධ විය. එම කිරණය මත පදනම්ව සමගර රැකියා තනතුරු සහ රාජකාරි වෙත පහත වෙනස්කම් සිදු කරන ලදී: මානව සම්පත් හා පරිපාලන ප්‍රධානී (HM 1-1), මුදල් හා ප්‍රසම්පාදන ප්‍රධානී (HM 1-1), මණ්ඩලීය ලේකම්/ ජේHෂ්ඨ නීති නිලධාරී (MM 1-1), ජේHෂ්ඨ නීති නිලධාරී (MM 1-1), නීති නිලධාරී (JM 1-1) මෙම තනතුරු බඳවා ගැනීමේ යෝජනා ක්‍රම සඳහා අනුමැතිය සඳහා අධිකරණ, මානව හිමිකම් හා නීති ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය හරහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවට යවන ලදී.

2021 වසර පුරාවටම, වෙනත් රැකියා සඳහා කාර්ය මණ්ඩල සාමාජිකයින් හත් (07) දෙනෙකු, අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයෙන් ඉවත් වූ අතර, කොන්ත්‍රාත් පදනම් මත සිටි කාර්ය මණ්ඩල සාමාජිකයින් 01 කෙනෙකු සිය සේවා කාලය අවසන් කළේ ය. ද්විතීයික පදනම් මත සිටි එක් සාමාජිකයෙකු අදාළ අමාත්‍යාංශය වෙත මුදා හරින ලදී.

2020 නොවැම්බර් 30 දින සිට ක්‍රියාත්මක වන පරිදි 2021 දෙසැම්බර් 10 දක්වා අතිගරු ජනාධිපතිතුමා විසින් ගරු විශ්‍රාමලත් විනිසුරු උපාලි අබෙරත්න මහතා අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ සභාපති ලෙස පත් කරන ලදී. 2021 දෙසැම්බර් 16 වනදා මහේෂ් කටුලන්ද මහතා (නීතිඥ) සභාපති ලෙස පත් කරන ලදී. අධ්‍යක්ෂ මණ්ඩලය පහත පරිදි වේ:

#	සම්පූර්ණ නම	තනතුරු නාමය	පත්වීම් දිනය
1	මහේෂ් කටුලන්ද මහතා (නීතිඥ)	සභාපති	2021 දෙසැම්බර් මස 16 දින
2	විජේකෝන් බණ්ඩාර ගනේගල මහතා	මණ්ඩල සාමාජික	2021 අප්‍රේල් 29
3	සිතී ඩෙන් අර්හා කාසීම් මිය	මණ්ඩල සාමාජික	2021 අප්‍රේල් 29
4	කමලසියා යෝගරාජා මහතා	මණ්ඩල සාමාජික	2021 මැයි 6
5	ආචාර්ය ජගන්ත පික්‍රමරත්න	මණ්ඩල සාමාජික	2021 දෙසැම්බර් මස 16 දින
6	ශිරාස් එම්.නූර්දීන් මහතා	මණ්ඩල සාමාජික	2021 දෙසැම්බර් මස 23 දින

b. ප්‍රාදේශීය කාර්යාල

අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ ප්‍රාදේශීය කාර්යාල අතුරු වාර්තා සඳහා සහාය වෙමින් පවුල් වලින් පැමිණිලි ලබා ගත් අතර අදාළ රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන සමග සාකච්ඡා ද පැවැත්වූහ.

ප්‍රාදේශීය කාර්යාල වෙත පවුල් පැමිණීම් ගණන පහත දක්වා ඇත.

ප්‍රාදේශීය කාර්යාලය	2021 වසරේ පැමිණිලි ගණන
මාතර	485
මන්නාරම	654
යාපනය	344
මඩකලපුව	455
කිලිනොච්චිය (2021 අගෝස්තු මස සිට)	55
එකතුව	1993

c. පවුල් කොමරහි මනෝ සමාජීය ප්‍රතිචාර දැක්වීම සහ සංවේදීනාව සහතික කිරීම

අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය විසින් 2020 දී මණ්ඩලය විසින් සම්මත කරන ලද එහි මනෝ-සමාජ උපාය මාර්ගයට අනුකූලව සිය විධි නියෝගයන් ක්‍රියාත්මක කිරීම අඛණ්ඩව සිදු කළේ ය. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය වෙත පැමිණෙන පවුල් මුලින්ම සම්බන්ධ වන්නේ ප්‍රධාන කාර්යාලයේ මෙන්ම ප්‍රාදේශීය කාර්යාලවලද සිටින පවුල් සාමාජිකයන්, මහජනතාව සමඟ සෘජුව කටයුතු කරන්නා පවුල් සහ නිලධාරීන් සමඟය. ඉන්පසු ඔවුන් පැමිණිලි සටහන් කරගෙන තොරතුරු සපයා පසුවිපරම් කටයුතු සඳහා අනෙක් ඒකක සහ කාර්ය මණ්ඩල සමඟ සාකච්ඡා කරයි.

අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය විත්තිකයන් සහ පවුල් සාමාජිකයන් සමඟ වසර පුරා අදහස් හුවමාරු කරගත්තේ ය. කෙසේ වෙතත්, පවතින කොවිඩ්-19 වසංගතය හේතුවෙන් මහජන සෞඛ්‍ය සහ ආරක්ෂාව පිළිබඳ ගැටළු සහ සීමා කිරීම් හේතුවෙන් ප්‍රගතියට දැඩි ලෙස බාධා එල්ල විය.

ඇ. ධාරිතා වර්ධනය හා දැනුම් බෙදාගැනීම්

අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය, 2021 වසරේදී අධිකරණ නොවන නිලධාරීන් සඳහා ශ්‍රී ලංකා සංචර්ධන පරිපාලන අංශකනය සමඟ එක්ව 5S පුහුණුවක් ලබා දෙනු ලැබී ය. එමෙන්ම ශ්‍රී ලංකා සංචර්ධන පරිපාලන ආයතනය සමඟ එක්ව MM1-1, JM1-1 සහ MA 1-1 තනතුරු රාජ්‍ය සේවයේ ස්ථිර කිරීම සඳහා කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්වීමට සැලසුම් කරමින් සිටී.

ඈ. අත්තාරුරු දැනගැනීමේ අයිතිය

2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිය පනත යටතේ අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය සතු තොරතුරු වෙත පිවිසීම ලබා දිය යුතු ය. පහත වගුව මඟින් 2021 වසර තුළ අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය තොරතුරු දැනගැනීමේ අයිතිය ක්‍රියාත්මක කළ ආකාරය දක්වා ඇත.

අංකය	විෂය	දින ගණන
1	2021 වසර තුළ කළ ඉල්ලීම් ගණන	28
2	සම්පූර්ණ තොරතුරු ලබාදෙනු ලැබූ ඉල්ලීම් ගණන	28
3	අර්ධ වශයෙන් තොරතුරු ලබාදෙනු ලැබූ ඉල්ලීම් ගණන	0
4	පනතේ 5 වන වගන්තිය අනුව ප්‍රතික්ෂේප කරන ලද ඉල්ලීම් ගණන	1
5	පනතේ 5 වන වගන්තියේ අඩංගු හේතු මත හැර ප්‍රතික්ෂේප කරන ලද තොරතුරු ඉල්ලීම් ගණන (උදා. තොරතුරු නොමැති වීම)	0
6	තොරතුරු ඉල්ලීම්වලට ප්‍රතිචාර දැක්වීමට ගන්නා ලද සාමාන්‍ය කාල සීමාව කොපමණ ද (වැඩ කරන දින ගණන)	දින 14
7	තැපැලෙන් කෙතරම් තොරතුරු ඉල්ලීම් ගණනක් ලැබුණේ ද?	28
8	ඊමේල් මඟින් කෙතරම් තොරතුරු ඉල්ලීම් ගණනක් ලැබුණේ ද?	0
9	තැපැල හෝ ඊමේල් හැර වෙනත් ආකාරවලින් කෙතරම් තොරතුරු ඉල්ලීම් ගණනක් ලැබුණේ ද?	0

2021 වසරේදී අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාල සාමාජිකයින් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 15 ක් පවත්වා ඇති අතර අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ උපාය මාර්ගික සංවර්ධනය සම්බන්ධව සාකච්ඡා කරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස, අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය, පහසුවෙන් පවුල් සමඟ සම්බන්ධ වීම සඳහා එහි 5 වන ප්‍රාදේශීය කාර්යාලය කිලිනොච්චියේ පිහිටුවීමට තීරණය කරන ලද අතර 2021.08.12 දින එය විවෘත කරන ලදී.

අතුරු ආර්තා නිකුත් කිරීමේ ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම සඳහා සහ දිස්ත්‍රික් මට්ටමෙන් විමසුම් සිදු කිරීම සඳහා අවශ්‍ය කාර්ය මණ්ඩලය බඳවා ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයට අනුමැතිය ලබා දුන්නද අවශ්‍ය කාර්ය මණ්ඩලය සැපිරුණේ නැත. ප්‍රතිඵලයක් ලෙස, අතුරුදහන් වූ

කැනැත්තන් පිළිබඳ කාර්යාලයට මුළු දිවයිනම ආවරණය වන පරිදි පුහුණුවලත් විමර්ශන නිලධාරීන් යොදවා ජංගම විමසුම් ඒකක පිහිටුවීමේ සැලසුම් ඉවත ලෑමට සිදු විය.

පබ්ලික් වෙනින් අතුරු වාර්තා සඳහා ලැබෙන ඉල්ලීම් සැපිරීමට, විමසුම් සිදු කර අතුරු වාර්තා නිකුත් කිරීමට අතුරුදහන් වූ කැනැත්තන් පිළිබඳ කාර්යාලයේ ප්‍රාදේශීය කාර්යාලවලට ගමන් කරන අර්ධ කාලීන විමර්ශන නිලධාරීන් ලෙස කටයුතු කිරීම සඳහා දැනට සිටින කාර්ය මණ්ඩලයේ පුද්ගලයන් සිව් දෙනෙකු නම් කිරීමේ ක්‍රියාවලියක් අතුරුදහන් වූ කැනැත්තන් පිළිබඳ කාර්යාලය විසින් ස්ථාපිත කරනු ලැබී ය. කෙසේ වුවත්, කොවිඩ් 19 වසංගත තත්ත්වය සහ සංචරණ සීමා හේතුවෙන් මෙම ක්‍රියාවලිය තවදුරටත් ප්‍රමාද විය.

8.6 මූල්‍ය සහ ප්‍රසම්පාදනය

2021 වසර සඳහා විගණිත මූල්‍ය වාර්තා මෙ ගමන අමුණා ඇත. කාර්ය මණ්ඩල බඳවා ගැනීම් සහ වියංගතය ආශ්‍රිත සීමා කිරීම් හේතුවෙන් අතුරුදහන් වූ කැනැත්තන් පිළිබඳ කාර්යාලයට සැලසුම් කර ඇති පරිදි වැඩසටහන්කරණය සහ පරිපාලන කටයුතු යන දෙකෙහිම සිය මූල්‍ය ඉලක්ක සපුරා ගැනීමට නොහැකි විය. එබැවින්, විගණනය කරන ලද ගිණුම් සඳහා කාර්යාලයේ සුමට ක්‍රියාකාරිත්වය සහතික කිරීම සඳහා නව සභාපතිවරයා විසින් වසර අවසානයේදී මූල්‍ය හා ප්‍රසම්පාදන කෙරෙහි විශේෂ අවධානයක් යොමු කිරීම ආරම්භ කරන ලදී. (ඇමුණුම I)

8.7 සන්නිවේදනය සහ ප්‍රජා සම්බන්ධතාව

අතුරුදහන් වීම්වලට හේතු, සිදුවීම් සහ බලපෑම් පිළිබඳව මහජනතාව දැනුවත් කිරීම සහ ඔවුන්ගේ සාතීන්ගේ අවශ්‍යතා සපුරාලීම් සඳහා මහජන සහයෝගය ඇති කිරීම අතුරුදහන් වූ කැනැත්තන් පිළිබඳ කාර්යාලයට පැවරී ඇති එක් වගකීමකි.26 2018 දී අතුරුදහන් වූ කැනැත්තන් පිළිබඳ කාර්යාලය පිහිටුවීමේ සිට, අතුරුදහන් වූ කැනැත්තන් පිළිබඳ කාර්යාලයේ විධිනියෝග සහ වැඩ කටයුතු පිළිබඳව දැනුවත් කිරීම, අතුරුදහන් වීමේ ප්‍රතිවිපාක පිළිබඳව දැනුවත් කිරීම; අතුරුදහන් වූවන් ඔවුන්ගේ පවුල්වල අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා රාජ්‍යයේ සහ සමාජයේ වගකීම; සහ අතුරුදහන් වූ කැනැත්තන් පිළිබඳ කාර්යාලය සම්බන්ධයෙන් ඇති වැරදි වැටහීම් වැලැක්වීම සඳහා සන්නිවේදන උපාය මාර්ගයක් සකස් කර ඇත; මේ සඳහා මුද්‍රිත මාධ්‍ය හා ඩිජිටල් හා සන්නිවේදන වේදිකා තුළින් අතුරුදහන් වූවන්ගේ පවුල්, ප්‍රධාන පාර්ශ්වකරුවන් සහ සාමාන්‍ය ජනතාවට අතුරුදහන් වූ කැනැත්තන් පිළිබඳ කාර්යාලයේ වැඩ කටයුතු පිළිබඳව දැනගැනීමට සහ ඉගෙන ගැනීමට හැකියාව තිබේ.27

සන්නිවේදන සහ ප්‍රජා සම්බන්ධතා ඒකකය තවමත් ස්ථාපනය කර නොමැති බැවින් සියලුම ක්‍රියාකාරකම් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම තුළ ඇති තනි ඒකක මඟින් ඉටු කර අධීක්ෂණය කරන ලදී. අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් මාධ්‍ය කටයුතු, මාධ්‍ය සාකච්ඡා සහ සන්නිවේදන අන්තර්ගතයන් අධීක්ෂණය කළහ.

a. *ඔජාපු අවස්ථා*

පවතින කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් අතුරුදහන් වූ කැනැත්තන් පිළිබඳ කාර්යාලයට පොදු වැඩසටහන් කිසිවක් පැවැත්විය නොහැකි විය. කෙසේ වෙතත් අතුරුදහන් වූ කැනැත්තන් පිළිබඳ කාර්යාලය, සියලුම අභ්‍යන්තර ඒකක, පාර්ශ්වකරුවන් සහ සමගි පර්ෂදය සමග සහයෝගයෙන් zoom තාක්ෂණය ඔස්සේ අතුරුදහන් වූ කැනැත්තන් පිළිබඳ ජාත්‍යන්තර දිනය සැමරුවේය.

b. *මාධ්‍ය සාමූහ සම්බන්ධතා*

[26] අතුරුදහන් වූ කැනැත්තන් පිළිබඳ කාර්යාල පනත, 13 (1) වගන්තිය.

[27] ඊමේල්: ompsrilanka@gmail.com; Twitter: https://twitter.com/ompsrilanka; Facebook: https://www.facebook.com/ompsrilanka

ජාත්‍යන්තර දින අතරතුර සාකච්ඡාව විකාශනය කරන ලද අතර සියලුම සමාජ, මුද්‍රිත, පුද්ගලික සහ රාජ්‍ය මාධ්‍යවල ප්‍රකාශයට පත් කරන ලදී. අතුරුදහන් වූ කැනැත්තන් පිළිබඳ කාර්යාලයේ සභාපති, ගරු අමාත්‍යතුමා, ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සහ ආචාර්ය ශුරේන් රාඝවන් විසින් ඉස්මතු කළ කරුණු මෙහි දක්වා ඇත.

c. ඩිජිටල් මාධ්‍ය මඟින් පැවැසීම්

ඩිජිටල් වෙදිකා හරහා මහජනතාව සමඟ සම්බන්ධ වීම පිණිස අතුරුදහන් වූ කැනැත්තන් පිළිබඳ කාර්යාලය Twitter[28] සහ Facebook[29] සමාජ මාධ්‍ය ගිණුම් ඇරඹීය. 2021 දෙසැම්බර් 31 වන විට අතුරුදහන් වූ කැනැත්තන් පිළිබඳ කාර්යාලයේ ෆේස්බුක් හි අනුගාමිකයන් 5,149 ක් සහ ට්විටර් හි අනුගාමිකයන් 1,866 ක් සිටියහ.

අතුරුදහන් වූ කැනැත්තන් පිළිබඳ කාර්යාලයට තම වැඩකටයුතුවලට මහජනතාවට ප්‍රවේශ වීමට ඉඩ සැලසීම සඳහා 2020 නොවැම්බර් 19 වන දින එහි පළමු වෙබ් අඩවිය ඉංග්‍රීසි මාධ්‍යයෙන් දියත් කිරීමට හැකි විය. 2021 ජනවාරි මස වෙබ් අඩවිය සිංහල සහ දෙමළ භාෂාවලින් පළ කරනු ලැබී ය. 2021 දෙසැම්බර් 31 දින වෙබ් අඩවියට 50 දෙනෙකු පැමිණ තිබිණි.

9. 2021 වසරේ අභියෝග

2021 වසර තුළ කාර්ය සාධනයේ ලා විශාල අභියෝග ප්‍රමාණයක් එල්ල විය. අතුරුදහන් වූවන්ගේ පවුල් වෙත ළඟා වීමේ ප්‍රධාන අභියෝගයක් වූයේ කොවිඩ් 19 හේතුවෙන් සංචරණ සීමා පැනවීමයි.

2016 අංක 14 දරන අතුරුදහන් වූ කැනැත්තන් පිළිබඳ කාර්යාල පනත, 11 (අ) වගන්තිය, 2017 සංශෝධනය (2017 අංක 09) මඟින් අවලංගු කිරීමත් සමඟ ප්‍රතිපත්තිමය වශයෙන් අභියෝගයන් සමඟ විය. මෙම සංශෝධනය අනුව අතුරුදහන් වූ කැනැත්තන් පිළිබඳ කාර්යාලයට ස්වාධීන ආයතනයක් ලෙස කටයුතු කිරීමේ අභිරුචාවන් ඇති විය. මක් නිසාද කිසියම් පුද්ගලයෙකු හෝ සංවිධානයක් සමඟ ගිවිසුමකට එළඹීමේදී අතුරුදහන් වූ කැනැත්තන් පිළිබඳ කාර්යාලයේ පිඩි නියෝගය සැපිරිය යුතු වීම නිසා ය.

එමෙන්ම,අතුරුදහන් වූ කැනැත්තන් පිළිබඳ කාර්යාලය ශීමික මානව සම්පත නිසාද බරපතල අභියෝගයන්ට මුහුණ දෙයි. ස්වාධීන ආයතනයක් ලෙස අතුරුදහන් වූ කැනැත්තන් පිළිබඳ කාර්යාලය එහි නායකත්වය වෙනස්වීම මත දැඩි අභියෝගයන් රැසකට මුහුණ දුන්නේ ය. තවත් ප්‍රධානතම අභියෝගයක් වූයේ අනුමත සේවක සංඛ්‍යාව බඳවා ගැනීමයි. වසරේ අවසන් කාර්තුව තුළ නව සභාපතිගේ නායකත්වය සමඟ අතුරුදහන් වූ කැනැත්තන් පිළිබඳ කාර්යාලය අධිකරණ අමාත්‍යාංශය සහ වෙනත් අමාත්‍යාංශ සහ පාර්ශ්වකරුවන් සමඟ මෙම අභියෝග ජයගැනීම සඳහාභිතකර සංවාදයන්හි නියැළුණේ ය.

10. ඉදිරි ගමන

නව නායකත්වය සමඟ අතුරුදහන් වූ කැනැත්තන් පිළිබඳ කාර්යාලය, තම ක්ෂේත්‍ර අට තුළ වඩා කාර්යක්ෂම සහ ඵලදායී සේවයක් සැපයීම සඳහා පස් වසර මාර්ග සිතියමක් සංවර්ධනය කිරීම, කාර්ය මණ්ඩලය බඳවා

"අතුරුදහන් වූ කැනැත්තන් පිළිබඳ කාර්යාලයේ ට්විටර් ගිණුම" (2018 ජූනි 24) <https://twitter.com/ompsrilanka> (2020 දෙසැම්බර් 22 දින පිවිසුණි).

[29] "අතුරුදහන් වූ කැනැත්තන් පිළිබඳ කාර්යාලයේ Facebook ගිණුම" (2018 ඔක්තෝබර් 23) < https://www.facebook.com/ompsrilanka/> (2020 දෙසැම්බර් 22 දින පිවිසුණි).



අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය

වාර්ෂික මූල්‍ය වාර්තාව

2021

අකුරුදහන් වූ කැනැත්තන් පිළිබඳ කාර්යාලය
2021 දෙසැම්බර් 31 වන දිනට මූල්‍ය තත්වය

වත්කම්	යටහන	2021 (රු)	2020 (රු)
ජංගම නොවන වත්කම්			
දේපළ, පිරියත සහ උපකරණ	1	22,284,177.16	28,102,075.67
ජාත්‍යන්තර දින සැමරුම්			
ජංගම වත්කම්			
පෙරගෙවූ වියදම්	2	110693.32	36,108.00
ලැබීම්	3	6,63,015.35	3,65,330.40
මුළු වත්කම්		**2,30,57,885.83**	**2,85,03,514.07**
බැරකම්			
ජංගම නොවන බැරකම්			
පාරිතෝෂික ප්‍රතිපාදන		13,54,447.50	7,43,120.00
ජංගම වගකීම්			
උපචිත වියදම්	4	38,43,088.34	43,12,609.44
ණයකරුවන්	5	27,830.00	27,830.00
ගෙවිය යුතු වැටුප්	6	24,603.13	24,603.13
මුළු බැරකම්		**52,49,968.97**	**43,65,042.57**
ශුද්ධ වත්කම්/ස්කන්ධ			
ශුද්ධ වත්කම්	7	1,78,07,916.86	2,33,95,351.50
මුළු ස්කන්ධ සහ බැරකම්		**2,30,57,885.83**	**2,85,03,514.07**

සහතිකකරණය
ඉහත මූල්‍ය ප්‍රකාශ 2021 දෙසැම්බර් 31 දිනට සත්‍ය හා සාධාරණ දැක්මක් ලබා දී ඇති බව අපි සහතික කරමු.

බී.කේ සුසිල් පෙරේරා
අධ්‍යක්ෂ (මූල්‍ය සහ ප්‍රසම්පාදන)

ඩී.ඕ. දිසානායක
විධායක අධ්‍යක්ෂ

මූල්‍ය ප්‍රකාශ සැකසීම සහ ඉදිරිපත් කිරීම සම්බන්ධව අධ්‍යක්ෂ මණ්ඩලය වග කියනු ලැබේ. මෙම මූල්‍ය ප්‍රකාශ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද අතර ඔවුන් වෙනුවෙන් අත්සන් තබන ලදී.

මහේෂ් කටුලන්ද
සභාපති

ටී.යෝගරාජා
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික

ඩබ්.ඩී.ගනේගල
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික

අකුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය

ආදායම් සහ වියදම් ප්‍රකාශය

2021 දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා

	සටහන	2021 (රු)	2020 (රු)
ආදායම්			
ආදායම් - පුනරාවර්තන ප්‍රදාන		7,68,04,556.45	8,13,00,000.00
මුළු ආදායම්			**8,13,00,000.00**
වියදම්			
සේවක වියදම්	8	3,30,11,432.94	3,95,20,158.83
ප්‍රවාහන දීමනා	9	17,84,134.03	28,45,326.00
සැපයුම් සහ භාවිත කළ පරිභෝජ්‍ය භාණ්ඩ	10	30,00,278.95	28,43,155.99
නඩත්තු වියදම්	11	4,45,336.78	3,57,896.18
ක්ෂය වීම්		58,45,568.51	57,63,215.89
සේවාවන්	12	3,81,83,866.49	3,30,23,155.77
මුළු වියදම්		**8,22,70,617.70**	**8,43,52,908.66**
කාල සීමාව සඳහා අතිරික්තය/ (ඌනතාව)		**(54,66,061.25)**	**30,52,908.66**

අතුරුදහන් වූ කැනැත්තන් පිළිබඳ කාර්යාලය

ස්කන්ධ වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය

2021 දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා

	භාණ්ඩාගාරය විසින් ප්‍රදානය කළ ප්‍රාග්ධනය	සමුච්චිත අරමුදල්	වසර සඳහා අතිරික්තය/ (ඌනතාව)	එකතුව
	(රු)	(රු)	(රු)	(රු)
2020/01/01 දිනට ආරම්භක ශේෂය	-	34,118,439.21	-	34,118,439.21
පූර්ව වසර ගැලපුම්	-	(8,370,179.05)	-	(8,370,179.05)
භාණ්ඩාගාර ප්‍රාග්ධන ප්‍රදාන	7,00,000.00	-	-	7,00,000.00
2020 වසර සඳහා අතිරික්තය/ (ඌනතාව)	-	-	(30,52,908.66)	(30,52,908.66)
2020/12/31 වන දිනට ශේෂය	7,00,000.00	2,57,48,260.16	(30,52,908.66)	2,33,95,351.50
2021/01/01 දිනට ආරම්භක ශේෂය	-	2,33,95,351.50	-	2,33,95,351.50
පූර්ව වසර ගැලපුම්	-	(1,66,623.39)	-	(1,66,623.39)
පූර්ව වර්ෂය අතිරික්තය(ඌනතා) ගැලපුම්	-	6,000.00	-	6,000.00
භාණ්ඩාගාර ප්‍රාග්ධන ප්‍රදාන	39,250.00	-	-	39,250.00
2021 වසර සඳහා අතිරික්තය/ (ඌනතාව)	-	-	(54,66,061.25)	(54,66,061.25)
2021/12/31 වන දිනට ශේෂය	39,250.00	2,32,34,728.11	(54,66,061.25)	**1,78,07,916.86**

අතුරුදහන් වූ කැනැක්කන් පිළිබඳ කාර්යාලය

පිරික්සුම් ශේෂය

31.12.2021 දිනට

ගිණුම් කේතය	විස්තරය	DR	CR
1001	වැටුප් හා වේතන	17,365,849.31	
1002	අතිකාල සහ නිවාඩු දින ගෙවීම්	71,315.39	
1003	Col දීමනා	2,890,982.73	
1004	සේ.අ.අ. 12%	2,363,455.23	
1005	සේ.නි.හා.අ 3%	583,542.62	
1006	පූහුණුවන්නන් වෙත දීමනා	483,749.00	
1101	ගමන් වියදම් - දේශීය	93,005.00	
1101/1	ප්‍රවාහන දීමනා - සභාපති සහ කොමසාරිස්	1,691,129.03	
1201	ලිපිද්‍රව්‍ය සහ කාර්යාල අවශ්‍යතාව	1,131,334.85	
1202	ඉන්ධන	1,625,927.81	
1203	ආහාර සහ නිල ඇඳුම්	243,016.29	
1301	වාහන නඩත්තුව	268,892.52	
1302	පිරියක සහ යන්ත්‍රෝපකරණ නඩත්තු කටයුතු	109,904.26	
1303	ගොඩනැගිලි සහ ඉදි කිරීම් නඩත්තුව	66,540.00	
1003/1	විෂ්නීය දීමනා	252,483.86	
1003/2	සභාපති සහ කොමසාරිස් දීමනා	4,907,939.54	
1304	ක්ෂය වීම්	5,845,568.51	
1401	වාහන දීමනාව	2,579,301.52	
1401/1	ප්‍රවාහන වෙනත්	447,816.86	
1402	තැපැල් හා යන්ත්‍රීවේදන	181,260.14	
1402/1	දැන්වීම් සහ ප්‍රචාරණ වියදම්	508,648.40	
1402/2	දුරකථන ගාස්තු	606,784.70	
1402/3	දූරකථන දීමනා	827,566.24	
1402/4	මුද්‍රණය සහ පරිවර්තන කටයුතු	1,842,624.50	
1403	විදුලිය	2,232,911.15	
1403/1	ජලය	235,727.03	
1404	බදු, කල්බදු සහ කුලී	25,677,622.44	
1405	කාර්ය මණ්ඩල පූහුණුව සහ ඒකක සංවර්ධනය	24,000.00	
1408	පාරිභෝගික	685,247.50	
1409	වෙනත් සේවාවන්	187,263.29	
1409/1	පවිත්‍රකා සේවාවන්	1,511,376.72	
1409/2	ආරක්ෂක සේවා	4,527,476.26	
1409/3	අතුරු වාර්තා විමසුම් වියදම්	162,450.00	
1409/5	නීති සේවා	37,905.00	
1801	බැහැර කිරීම්		6,000.00
2001	ගොඩනැගිලි සහ ඉදිකිරීම්	798,638.80	
2102	ගෘහ භාණ්ඩ සහ සවිකිරීම්	10,506,496.74	

2103	පරිගණක	15,508,207.18	
2104	කාර්යාල උපකරණ	2,388,000.62	
2105	සන්නිවේදන උපකරණ	228,326.68	
2106	ඡායා පිටපත් සහ ස්කෑනර්	5,679,650.00	
2200/1	ලැබීම්	663,015.35	
2200/3	පෙර ගෙවූ වියදම්	110,693.32	
2201	උපචිත වියදම්		3,843,088.34
2201/1	ණයකරුවන්		27,830.00
2201/2	ගෙවිය යුතු වැටුප්		24,603.13
2201/3	සමුච්චිත ක්ෂය වීම		12,825,142.86
2201/4	පාරිතෝෂික ප්‍රතිපාදන		1,354,447.50
3000	අරමුදල්- පුනරාවර්තන		76,804,556.45
3002	අමාත්‍යාංශය - ප්‍රාග්ධන		39,250.00
3003	ඉදිරියට ගෙන ආ ප්‍රාග්ධනය		23,395,351.50
3003/1	පූර්ව ගැලපුම්	166,623.39	
	එකතුව	118,320,269.78	118,320,269.78

අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය
මූල්‍ය ප්‍රකාශනවලට යටහන්
2021 දෙසැම්බර් 31 වන දිනට

යටහන කේත (රු)

1 *දේපළ පිරියත*
උපකරණ

	වර්ගය	දිනට ශේෂය	එකතුකිරීම්	බැහැර කිරීම	ගැලපුම්	දිනට ශේෂය
		01.01.2021				31.12.2021
2001	ගොඩනැගිලි සහ ඉදි කිරීම්	798,638.80	-	-		798,638.80
2101	මෝටර් වාහන	10,925.00	-	-	10,925.00	10925.00
2102	ගෘහ භාණ්ඩ සහ සවිකිරීම්	10,506,496.74		-		10,506,496.74
2103	පරිගණක	21,320,907.18	-	-	(5,812,700.00)	15,508,207.18
2104	කාර්යාල උපකරණ	2,347,300.62	40,700.00	-		2,388,000.62
2105	ඝන්නිවේදන	105,276.68	123,050.00	-		228,326.68
2016	උපකරණ	-	5,679,650.00	-		5,679,650.00
	ඡායා පිටපත් සහ ස්කෑනර්					
		35,089,545.02	**5,843,400.00**	-	**5,823,625.00**	**35,109,320.02**
